The Journal of the Faculty of Humanities (JHU) (2025), Volume 33, Issue 2, 79-114
ISSN 1391-5096 (Print), ISSN 2783 – 8951 (Online)

# විසි එක්වන සියවසේ සිංහල සාහිත්‍ය විචාරයේ ස්වභාවය, නියෝජනය, සහ දෘෂ්ටිමය ප්‍රවේශ

චින්තක රණසිංහ

## Abstract

Sinhalese literature in the twentieth century underwent significant ideological and stylistic transformations, especially during the decades following independence. Understanding these shifts requires examining the major literary groups that influenced the period. This study aims to examine Sinhalese literature from 1950 to 1970 and to identify the key literary groups active during this period, with special attention to the ideologies that shaped their contributions to the literary discourse. The research employs a historical approach based entirely on secondary data. Relevant literature was gathered through library research, and the analytical framework was informed by Steven Lynn's *Text and Contexts*. The study reveals that three major groups dominated the Sinhalese literary discourse during the selected period, each with its own ideological stance: the Peradeniya University Group, the *Hela Havula* Group, and the Group belonging to the Second Phase of Colombo Poetry. The analysis concludes that modernism served as the central ideological foundation for these groups. Although critics who opposed the Peradeniya literary school differed in

their specific viewpoints, they commonly directed their criticism against the modernist principles that characterized the Peradeniya tradition.

**Key Words:** *Colombo Poetry, Hela Havula, Literature, Peradeniya School*

## හැඳින්වීම

නූතන සිංහල සාහිත්‍ය විචාරය සඳහා ආරම්භක පදනම නිර්මාණය වන්නේ ජේම්ස් ද අල්විස් (1823-1878) විසින් සිදත් සඟරාව ඉංග්‍රීසියට පරිවර්තනය කොට ඒ සඳහා ලියන ලද දීර්ඝ හැඳින්වීමෙනි (Alwis, 1852). එම හැඳින්වීමේදී ප්‍රථම වරට පැරණි සිංහල සාහිත්‍යය යුගවලට බෙදා වෙන් කරන ලද අතර සිංහල භාෂාවේ ප්‍රභවය පිළිබඳවද අදහස් ඉදිරිපත් කෙරිණි. අල්විස්ගෙන් පසු ඩබ්. එෆ්. ගුණවර්ධන (1861-1935), ගුත්තිල කාව්‍ය වර්ණනා (1907) කෘතිය සඳහා ලියූ දීර්ඝ හැඳින්වීමේදී පෙරදිග ප්‍රධාන විචාර සිද්ධාන්තයක් වූ සංස්කෘත අලංකාරවාදය පිළිබඳ සාරවත් විවරණයක නිරත විය. මේ යුගයේ බොහෝ සම්භාව්‍ය සිංහල ග්‍රන්ථ සංස්කරණය කොට පළ කිරීම සිදු වූ අතර එම කෘති සඳහා ලියූ හැඳින්වීම යම් ආකාරයකින් ඒ ඒ කෘතීන් පිළිබඳ තත්ත්ව නිර්ණය කිරීමට උත්සාහ ගැනුණු මුත් සෛද්ධාන්තික හා විග්‍රහාත්මක ප්‍රවේශ ඔස්සේ නිර්මාණය කෙරුණු විචාර කලාවක් දක්නට නොලැබිණි. අල්විස්ගේ සිදත් සඟරා හැඳින්වීමෙහි බටහිර සාහිත්‍ය සම්ප්‍රදාය විශේෂයෙන්ම එහි සම්භාව්‍ය යුගය පිළිබඳ සඳහන් කිරීමක් පැවති නමුත් නූතන බටහිර සාහිත්‍ය විචාර සිද්ධාන්ත මුල් වරට සිංහල සාහිත්‍ය විචාරය සඳහා වඩාත් සංයුක්තව යොදා ගැනීම සිදුකළේ එදිරිවීර සරච්චන්ද්‍ර (1914-1996) විසිනි. ඒ 1943 පළ කළ Modem Sinhalese Fiction කෘතිය මගිනි. මාර්ටින් වික්‍රමසිංහ (1891-1976) හා ජී. බී. සේනානායක (1915-1985) යන දෙදෙනා සිංහල මාධ්‍යයෙන් බටහිර විචාර සිද්ධාන්ත පිළිබඳ තම කෘතිවල සාකච්ඡාවට ලක් කර තිබූ මුත් එම මැදිහත්වීම පැවතුණේ සංසන්දනාත්මක තත්ත්වයකය (රණසිංහ, 2022, රණසිංහ, 2024). සරච්චන්ද්‍ර තම ග්‍රන්ථය 1951 දී සිංහල නවකථා ඉතිහාසය හා විචාරය යන නමින් සිංහලට පරිවර්තනය කළ අතර ඉතා කෙටි කාලයක් තුළ

එම කෘතිය සිංහල පාඨකයා අතර බෙහෙවින් ජනප්‍රිය වූ බවත්, මුද්‍රණ වාර ගණනාවක් නිර්මාණය වූ බවත් පෙනේ (තෝරදෙණිය, 2018: 164). මෙම කෘතියේ දෙවන සංස්කරණයට ප්‍රස්තාවනාවක් සපයන සරච්චන්ද්‍ර පවසන්නේ ආලංකාරිකයන් විසින් එක්තරා ගතානුගතික අච්චුවක දමා සිරගත කරන ලද කථා කලාව බටහිර ලේඛකයන්ගේ නොයෙකුත් අත්හදා බැලීම් නිසාත්, රසිකයන්ගේ වර්ධනය වී ගෙන එන රුචිය නිසාත් ආකෘතිය අතින් වෙනස් වන්නට පටන්ගත් බවයි (සරච්චන්ද්‍ර, 1963: iv). එහිදී ඔහු තවදුරටත් පෙන්වා දෙන්නේ කල්පිත කථා සම්ප්‍රදායේ වර්තමාන සංවර්ධනය අපරදිග සාහිත්‍යයන්හි සිදු වූ බැවින් අපරදිග රසාස්වාදන ක්‍රම සසඳා බැලීමෙන් නවකථාවේ නියම රසය හඳුනාගැනීම සඳහා බටහිර ශ්‍රේෂ්ඨ නවකථා පරිශීලකයන් අවශ්‍ය වන බවය. නූතන සිංහල නව කථාව සම්බන්ධයෙන් ඇරඹුණු මෙම විචාර කතිකාව මාර්ටින් වික්‍රමසිංහ, ජී. බී. සේනානායක හා සරච්චන්ද්‍ර වික්‍රමසූරිය වැනි විචාරකයන් විසින් වර්ධනය කරන ලද ආකාරය නිරීක්ෂණය කළ හැකිය. මේ අතුරින් වික්‍රමසූරිය වඩාත් සුවිශේෂ අනන්‍යතාවක් සහිත විචාරකයෙකු වන්නේ එදිරිවීර සරච්චන්ද්‍ර මෙන්ම පේරාදෙණිය සරසවිය නියෝජනය කිරීමත්, තම විචාර ලේඛන මඟින් එදිරිවීර සරච්චන්ද්‍රගේ අදහස් ඉදිරියට ගෙන යාමත් නිසාය. වික්‍රමසූරිය සිංහල නවකථාව විචාරය කිරීම සඳහා නවකථා විවරණය (1963), සිංහල නවකථාවේ විකාශනය (1963), විජයබා කොල්ලය විවරණය (1963), සිංහල නවකථාවට මඟ පෑදීම (1970), සිංහල නවකථාවේ නැඟීම (1972) යනාදී වශයෙන් කෘති පහක් පළ කළේය.

මේ අතර කොළඹ කවියේ දෙවන ධාරාව, නැතහොත් දෙවන භාගය ලෙස හඳුන්වන පිරිස පැරණි කාව්‍ය සම්ප්‍රදාය විවේචනය කරමින් නව කවි සම්ප්‍රදායක් නිර්මාණය කිරීම සඳහා දැඩි උද්වේග යකින් ක්‍රියාත්මක වූ බව නිරීක්ෂණය කළ හැකිය. එදිරිවීර සරච්චන්ද්‍ර පෙන්වා දෙන්නේ, මෙම කවීන් බයිරන්, ෂෙලී, කීට්ස්, වර්ඩ්ස්වර්ත්, ටෙනිසන් සහ පෝප් වැනි ඉංග්‍රීසි කවීන්ගේ ආභාසය ලබා කාව්‍ය රචනයෙහි නිරත වූ බවයි (සරච්චන්ද්‍ර, 2016: 250). මේ වනාහි පැරණි සිංහල කවියන් තම කාව්‍ය නිර්මාණවලදී මුහුණ නොදුන් නව අත්දැකීම කලාපයක් සොයා යෑමක් මෙන්ම දේශීය අත්දැකීම් ප්‍රතිනිර්මාණය කිරීම සඳහා දිගුකාලීන පැවැති පෙරදිග ආභාසය වෙනුවට පුළුල් ලෙස

අපරදිග සාහිත්‍ය සම්ප්‍රදායේ බලපෑම ලබා ගැනීමක් ද වන්නේය. මේ අනුව බලන විට විසිවන සියවසේ ආරම්භයේ සිටම සිංහල සාහිත්‍යය තුළ පවතින විවිධ ඍානරවල නවීන බවක් මෙන්ම පැරණි සම්ප්‍රදාය පුපුරුවා හැරීමක්ද දක්නට හැකි විය. නව යුගයක් නව සාහිත්‍ය චින්තනයක් හා නව විධික්‍රම ගණනාවක් නිර්මාණය වෙමින් පැවැති අතර, 1940 පමණ වන විට එම තත්ත්වය වඩාත් පරිපූර්ණව සෑම පාර්ශ්වයකට නියෝජනයක් ද සහිතව ගොඩනැගුණු බව නිරීක්ෂණය කළ හැකිය. 1957 නොවැම්බර් 08 වෙනිදා පේරාදෙණිය සරසවියේ පැවති උපාධි ප්‍රදානෝත්සවයේදී බණ්ඩාරනායක මහතාට ද උපාධියක් පිරිනමන ලද අතර එහිදී කථාවක් පැවැත්වූ ඔහු පවසා ඇත්තේ "මේ යුගය වනාහී දිරාපත් වී මැරී යන ශිෂ්ටාචාරයක් තිබුණු තැනට අලුත් සමාජයක් පත් වන්නට වීරිය කරන පරිවර්තන සමාජයක් බිහි කරන යුගයක් බවයි" (වික්‍රමසිංහ, 1960: 171 - 173). බණ්ඩාරනායකගේ යථෝක්ත ප්‍රකාශයෙන් ගම්‍ය වන්නේ මේ යුගයෙහි යම් සැලකිය යුතු නව ප්‍රවණතා බිහිවන ආකාරය පිළිබඳ ඔහු තුළ සවිඥානික අවබෝධයක් තිබූ ආකාරයයි. පේරාදෙණිය විශ්වවිද්‍යාලය පවා සමාජ, සංස්කෘතික හා දේශපාලන පෙරළිය ඉදිරියේ නම්‍යශීලිත්වයක් දැක් වූ බව බණ්ඩාරනායක වෙත ආචාර්ය උපාධිය ප්‍රදානය කිරීමෙන් කියවෙන සත්‍යයයි. 1948 දී නිදහස ලබාගැනීමත්, 1956 සිදු වූ සුළු ධනේශ්වර සමාජ කොටස්වල අභිලාෂයන් මල්ඵල ගැන් වූ දේශපාලන පෙරළියත් සමග සමස්ත සමාජ චින්තනයේම පැහැදිලි විපර්යාසයක් පිළිබඳ අදහසක් සමාජයෙහි පැතිර ගිය බව නිරීක්ෂණය කළ හැකිය. හතළිහ දශකයේ අග භාගය වන විට සිංහල පුවත්පත් මුල් කොට ගනිමින් සිංහල භාෂාවේ හා සාහිත්‍යයේ ඇති වී තිබූ ප්‍රබෝධය සැලකිය යුතු එකකි. පසුකාලීනව ස්වාධීන ලේඛකයන් ලෙස මතු වූ බොහෝ ප්‍රවීණ සිංහල ලේඛකයන් මේ යුගයේ ලේඛන කලාවට පිවිසියේ හෙළ හවුලේ භාෂා ශෛලිය අනුගමනය කරමිනි. බුද්ධිමත් තරුණ පිරිස් කුමාරතුංග මුනිදාස වෙත ආකර්ෂණය වූ ආකාරයත්, තමා ඇතුළු බොහෝ සමකාලීන තරුණයන් හෙළ හවුලේ භාෂා මාර්ගය අනුගමනය කරමින් සාහිත්‍යකරණයට පිවිසි ආකාරයත් කේ. ජයතිලකගේ අවධානයට ලක් වෙයි (ජයතිලක, 1998: 29-30).

මේ අනුව කොළඹ කවිය මෙන්ම හෙළ හවුල යන ව්‍යාපාර දෙක යුගයේ සාහිත්‍යකාමී තරුණ පරපුර විසින් තම බුද්ධිමය අනන්‍යතාව

සාධනය කර ගැනීම සඳහා යොදා ගත යුතු බුද්ධිමය ව්‍යාපාර ලෙස සැලකූ බව නිරීක්ෂණය කළ හැකිය.

## පර්යේෂණයේ අරමුණු

මෙම පර්යේෂණයේ අරමුණු කිහිපයකි.

01. 1950-1970 යන දශක දෙක තුළ පැවැති සිංහල සාහිත්‍ය සංවාදයේ ස්වභාවය හඳුනාගැනීම.

02. එම සංවාදය හා එමඟින් ගොඩ නැගුණු නියෝජනය කළ කණ්ඩායම් හා උපකණ්ඩායම් (ඇතැම් විට පුද්ගලයන් විය හැකිය) හඳුනාගැනීම.

03. මෙම කණ්ඩායම් හෝ පුද්ගලයන් තුළ සාහිත්‍යය කෙරෙහි පැවැති දෘෂ්ටිමය ප්‍රවේශ හඳුනාගැනීම, විභාග කිරීම හා ඒ ඔස්සේ සිංහල සාහිත්‍යය හා විදේශීය සාහිත්‍යය අතර පවත්නා සම්බන්ධය විමර්ශනය කිරීම.

## වැදගත්කම

මෙම පර්යේෂණයේ වැදගත්කම වන්නේ ලාංකේය ජාතික රාජ්‍යයේ සංක්‍රාන්තික කාල පරිච්ඡේදයක (Transitional Period) සාහිත්‍ය සංවාදයේ ස්වරූපය හඳුනා ගනිමින් එය විමර්ශනය කිරීමයි. 1950-70 දශක දෙක බෙහෙවින්ම වැදගත් වන්නේ 1956 දී ඇති වුණු දේශපාලන පෙරළියත්, එය ලාංකේය සමාජයේ ග්‍රාමීය සුළු ධනේශ්වරයේ අවවරප්‍රසාද සහිත කොටස් රාජ්‍යයේ කේන්ද්‍රීයත්වය වෙතට රැගෙන ඒමත් නිසාය (Gunasinha, 1996: 217-235). එයින් සමාජ ස්තරය තුළ ව්‍යුහාත්මක වෙනසක් ඇති වූ අතර විශේෂයෙන්ම සිංහල භාෂාව හා සාහිත්‍යය යන සාධක දෙක විශාල බලපෑමක් ඇති කොට තිබෙන ආකාරය විද්වත් අවධානයට ලක් වී තිබේ (Dharmadasa, 1995: 132-135, වික්‍රමසිංහ, 1965ඃ 145-170). 1951 දී පේරාදෙණි සරසවිය බිහිවීම හා කොළඹ පැවැති යුනිවසිටි කොලීජියත් (1921) එයින් පසුව ස්ථාපිත වූ ලංකා විශ්වවිද්‍යාලයත් (1942) යන ආයතන

දෙකට වඩා වෙනස් පසුබිමක් පේරාදෙණිය සරසවිය කේන්ද්‍ර කොට ගත් සාහිත්‍යය හා විචාර කතිකාවෙහි දැකිය හැකි විය. එදිරිවීර සරච්චන්ද්‍රගේ ප්‍රමුඛත්වයෙන් යුතුව පේරාදෙණි සරසවියේ සිංහල අංශයෙහි නූතන සාහිත්‍ය කතිකාව නොයෙක් ආකාරයෙන් වර්ධනය වීමත් සමඟ සරච්චන්ද්‍ර කේන්ද්‍ර කොට ගනිමින් කවිය, නවකතාව වැනි සාහිත්‍යාංගවල නව ප්‍රබෝධයක් ඇති විය. මෙම ප්‍රබෝධයට සමාන්තරව විශ්වවිද්‍යාලයෙන් පරිබාහිර විවිධ සාහිත්‍ය කණ්ඩායම් හා පුද්ගලයන් සරච්චන්ද්‍රගේ ප්‍රමුඛත්වයෙන් නිර්මාණය වී ව්‍යාප්ත වූ මෙම අභිනව ප්‍රබෝධයට හේතු වූ ව්‍යාපාරයට නොයෙක් ආකාරයෙන් පහර එල්ල කළේය. මෙම මතවාදී සටන පුවත්පත්, සඟරා, පතපොත ආදී (එම යුගයේ රූපවාහිනිය හෝ වර්තමානයේ පවතින සමාජ මාධ්‍ය කිසිවක් නොතිබුණු නිසා ගුවන්විදුලිය හා මුද්‍රිත මාධ්‍ය වෙත අතිවිශාල හා ඒකාධිකාරී බලයක් සතු විය.) මාධ්‍යවලින් පිළිබිඹු වූ අතර මෙය ලාංකීක රාජ්‍යයේ සංස්කෘතික ගමන් මගෙහි අතිශයින්ම තීරණාත්මක සංවාදයක් බවට පත්විය. නූතන සිංහල සාහිත්‍යයේ ප්‍රකට සංකල්පයක් වූ පේරාදෙණිය ගුරු කුලය නිර්මාණය වුයේ එකී සංවාදය තුළය. එසේම, දේශීයත්වය හා නූතනවාදී සාහිත්‍යය අතරත් රොමැන්ටික්වාදය හා නූතනවාදය අතරත් ඇති වූ මතවාදී සංවාදය මෙම යුගයේදී ඇති විය. මේ අනුව මෙබදු තීරණාත්මක කාලවකවානුවක එය නියෝජනය කළ කණ්ඩායම්, පුද්ගලයන් හා ඔවුන්ගේ දෘෂ්ටිවාදාත්මක ප්‍රවේශය හඳුනාගැනීමත්, එය විභාග කිරීමත්, කීපාකාරයක වැදගත්කමක් අත්කර ගනියි.

## පර්යේෂණ පරතරය

මේ යුගයේ සිංහල සාහිත්‍ය සංවාදය පිළිබඳ පර්යේෂකයන්ගේ අවධානය යොමු වී ඇතත් ප්‍රමාණවත් ලෙස අප තෝරාගත් කතිකාව සම්බන්ධයෙන් ශාස්ත්‍රීය සාකච්ඡාවක් ගොඩනැගී නැත. රංජනී ඔබේසේකර වැනි මෙම යුගය පිළිබඳ අවධානය යොමු කළ ප්‍රධාන පෙළේ පර්යේෂිකාවකගේ අවධානය යොමු වී තිබෙන්නේ මාර්ටින් වික්‍රමසිංහගේ හා එදිරිවීර සරච්චන්ද්‍රගේ සාහිත්‍ය විචාර ක්‍රියාවලියේ ස්වරූපය විමර්ශනය කිරීම සඳහාය (Obeyesekere, 1973). වික්‍රමසිංහ යුරෝපීය විචාරකයන්ගෙන් ටී. එස්. එලියට්ට සම කරන ඇය

සරච්චන්ද්‍ර අයි. ඒ. රිචර්ඩ්ට සම කරන්නේ ඔවුන් දෙදෙනාගේ විචාර කතිකාව විශ්ලේෂණය කිරීමෙනි (Obeyesekere, 1973: 80-100). සේන තෝරදෙණිය වැනි විචාරකයකු පේරාදෙණි ගුරුකුලයේ සෘණාත්මක පාර්ශ්වය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන අතරම ශාස්ත්‍රීය කෘතියක ගැබ් විය යුතු විමර්ශනාත්මක භාවය හා බුද්ධිගෝචර බව වෙනුවට භාවාත්මක ලෙස ප්‍රහාරයම මුල්කොට ගත් බව නිරීක්ෂණ කළ හැකිය (තෝරදෙණිය, 2018). ගාමිණී සුමනසේකර, අජිත් සමරනායක, තිස්ස ජයතිලක වැනි විද්වතුන්ගේ අවධානය මේ යුගය වෙත යොමු වී තිබේ. බොහෝ විට ඔවුන්ගේ අවධානය යොමු වී තිබෙන්නේ ලංකා විශ්වවිද්‍යාලය හා පේරාදෙණිය සරසවියත් ඊට සමාන්තරව ගොඩනැගුණු බුද්ධිමය හා සංස්කෘතික පාර්ශ්වයෙන් එක් කොටසක් විස්තර කිරීමට හෝ විශ්ලේෂණය කිරීමට පමණි (Samaranayake, 2003, Jayathilake, 2018). ඇන්ඩි ෂුබර්ට්ස් වැනි පර්යේෂකයන් මෙම යුගයත් විශ්වවිද්‍යාල අධ්‍යාපනයත් ගැන උනන්දුව දක්වා ඇතත් එය ඍජුව සාහිත්‍ය කතිකාව විශ්ලේෂණය කිරීමේ අභිප්‍රේරයෙන්ම සිදු කළ විමර්ශනයක් නොවන බව නිරීක්ෂණය කළ හැකිය (Schubert" 2020: 68-94). මේ අනුව මේ යුගයේ සාහිත්‍ය කතිකාව පිළිබඳ ලියවී ඇති බොහෝ ශාස්ත්‍රීය විමර්ශනවලදී (1950-70) දශක දෙක තුළ පැවති සිංහල සාහිත්‍ය සංවාදයේ ස්වභාවයත් එම සංවාදය නියෝජනය කළ හා එමඟින් නිර්මාණය වූ කණ්ඩායම් හා උපකණ්ඩායම් ගැනත් එම කණ්ඩායම්වල දෘෂ්ටිමය ප්‍රවේශ ගැනත් නිරවුල් හඳුනාගැනීමක් දක්නට නැත. එම නිසා මෙම පර්යේෂණයේදී එම සංවාදයේ ස්වභාවයත්, එම කණ්ඩායම්වල ස්වභාවයත් හඳුනාගනිමින් එම කණ්ඩායම්වල න්‍යායාත්මක ප්‍රවේශ හඳුනාගැනීමට උත්සාහ දරමි.

## සාහිත්‍ය විමර්ශනය

සිංහල සාහිත්‍ය කතිකාවෙහි 50-70 දශක අළලා ලියවුණු පත පොත හා ලිපි රාශියක් පවතින නමුත් මෙම සාහිත්‍ය විමර්ශනය සඳහා මෙහිදී අවධානය යොමු වූයේ ලිපි හා කෘතීන් කිහිපයක් වෙත පමණි. මේ අනුව සේන තෝරදෙණියගේ පේරාදෙණිය ගුරු කුලය (2018), ගාමිණී සුමනසේකරගේ පේරදෙණිවාද, මුසාවාද හා අවලාද (2021), පියසීලි විජේගුනසිංහගේ නූතන සිංහල පද්‍ය කාව්‍යය පිළිබඳ

විමර්ශනයක්, ජාතික ව්‍යාපාරය හා සම්බන්ධ කවින්ගේ පටන් අද්‍යතන කවීන් දක්වා (2017) කෘතිය, චින්තක රණසිංහගේ ගුණදාස අමරසේකර සහ පේරාදෙණි ගුරුකුලය (2009), වංශනාථ දේශ බන්දුගේ සාහිත්‍ය කොල්ලය (1961), කේ. එන්. ඕ. ධර්මදාසගේ පේරාදෙණිය උරුමය හා ආරිය රාජකරුණාගේ විචාර කෘති, The Peradeniya Contribution to Literature, Theatre and the Arts (1995). අනුර වික්‍රමසිංහගේ පේරාදෙණි විචාරය කෙරෙහි බලපෑ ශාස්ත්‍රීය පසුබිම (2019), චින්තා පවිත්‍රානිගේ කොළඹ තරුණ කවීන්ට සහ පේරාදෙණි කවීන්ට බලපෑ බටහිර කාව්‍ය විචාර (2019), චින්තක රණසිංහ ලියූ කොළඹ කවියට පේරාදෙණියෙන් එල්ල වූ ඇතැම් විචාරවල අගතිගාමී ස්වරූප - ආරිය රාජකරුණා හා විමල් දිසානායකගේ විචාර ඇසුරින් විමසා බැලීම (2019) වැනි ලේඛන වෙත අවධානය යොමු කෙරිණි. මේ ලේඛන සමස්තයක් ලෙස ගත් කල පේරාදෙණිය සාහිත්‍යයත් එම යුගයත් පිළිබඳ තොරතුරු සම්පාදනය කරන අතර ඇතැම් ලේඛනවලින් එම සාහිත්‍ය කතිකාවේ යම් යම් පාර්ශ්වයන් තෝරා ගනිමින් විග්‍රහ කිරීමේ ප්‍රවණතාවක් දැකිය හැකිය. ධර්මදාස, තෝරදෙණිය වැනි ලේඛකයන් එම කතිකාව පිළිබඳ විස්තර සපයන අතරම යම් යම් විචාරවලද නිරත වේ. සෙසු විචාරකයන් යම් නිශ්චිත විෂය ප්‍රදේශයක් තෝරා ගනිමින් තම විචාර ඉදිරිපත් කරන ලද බව පෙනේ. විසිවන සියවසේ සිංහල බුද්ධිමය කණ්ඩායම් කුමන ආකාරයෙන් සංවිධානය වී තිබේද? ඔවුන්ගේ දෘෂ්ටිවාදාත්මක එළඹුම් කුමනාකාරද? යන්න පිළිබඳ විස්තරාත්මක මෙන්ම විශ්ලේෂණාත්මක අධ්‍යයනයක් විමල් දිසානායක රචනා කළ Purism Language, and Creativity: The Sri Lankan Experience' නම් ලිපියේ ගැබ්වේ. එහිදී කතුවරයා භාෂාව හා සාහිත්‍යය පිළිබඳ තම තමන්ගේ න්‍යායාත්මක ප්‍රවේශ අනුගමනය කරන්නා වූ කණ්ඩායම් හතරක් හඳුනාගන්නා අතර, ඒ ඒ කණ්ඩායම්වල අනන්‍යතා වෙත සුවිශේෂ අවධානයක් යොමු කරයි (Dissanayake, 2011: 185-196). දිසානායකගේ එම අධ්‍යයනය අපගේ අධ්‍යයනය සඳහා අවශ්‍ය මූලික පදනම සැකසූ ලිපිය ලෙස හැඳින්විය හැකිය.

සේන තෝරදෙණියගේ පේරාදෙණි ගුරුකුලය කෘතියෙහි පේරාදෙණි විශ්වවිද්‍යාලය ආරම්භ කිරීම විශේෂයෙන්ම සිංහල අංශය ආරම්භ කිරීම හා එහි අධ්‍යයන ක්‍රියාවලිය ව්‍යුහගත කිරීම ගැන සාකච්ඡා කරයි. එහිදී ඔහුගේ විශේෂ අවධානය යොමු වන කාරණයක්

වන්නේ එහි සිංහල අධ්‍යයන ක්‍රියාවලියෙහි ඇතුළත් කරගත් කෘතීන් හා බැහැර කරන ලද කෘතීන් මොනවාද යන්න පිළිබඳ විස්තරාත්මකව ගෙනහැර පෑම වෙතයි පේරාදෙණි ගුරුකුලය තුළ ලියවුණු කෘතීන් හා විචාර පිළිබඳව මෙන්ම එයට එරෙහිව පැන නැගුණු සංවාදය මෙහිදී විශාල වශයෙන් උදාහරණ සහිතව සාකච්ඡා කොට තිබේ. වංශනාථ දේශබන්ධුගේ සාහිත්‍ය කොල්ලය කෘතියේදී පේරාදෙණි ගුරුකුලයේ යැයි සැලකෙන කෘති හා එම කෘතිවල ලේඛකයන් සිදුකර ඇත්තේ සිංහල ජාතිය, ආගම හා සංස්කෘතිය යන ත්‍රිත්වයට අපහාස කිරීමක් යැයි පෙන්වා දෙමින් ඔවුන්ව අපහාසකාමී ලෙස විවේචනය කොට තිබේ. පියසීලී විජේගුනසිංහගේ නූතන සිංහල පද්‍ය කාව්‍ය පිළිබඳ විමර්ශනයක් ජාතික ව්‍යාපාරය හා සම්බන්ධ කවීන්ගේ පටන් අද්‍යතන කවීන් දක්වා කෘතියෙහි සිරි ගුනසිංහ හා ගුණදාස අමරසේකර යන කවීන් දෙදෙනාගේ නිර්මාණවල දැකිය හැකි නූතනවාදී ආභාසයෙහි ස්වරූපයත් ඔහුන්ගේ කාව්‍ය නිර්මාණ කොළඹ යුගයේ කවීන්ගෙන් වෙනස් වන ආකාරයත් පිළිබඳ සාකච්ඡා කර තිබේ. කේ. එන්. ඕ. ධර්මදාසගේ සිංහල හා ඉංග්‍රීසි ලිපි දෙකෙහිම පොදුවේ ගෙනහැර පා ඇත්තේ 1940-1970 දශකත්‍රය තුළ කොළඹ ලංකා විශ්වවිද්‍යාලය හා පේරාදෙණි විශ්වවිද්‍යාලයෙහි පැවති ශාස්ත්‍රීය කතිකාවේ ඉතිහාසයයි. එම කතිකාව නියෝජනය කළ චරිත, ඔවුන්ගේ දායකත්වයන්හි ස්වභාවය වර්ෂානුක්‍රමිකව මැනවින් ගෙනහැර පෑම මෙම දෙකෙහිම කැපී පෙනෙන තත්ත්වයකි. අනුර වික්‍රමසිංහගේ පේරාදෙණි විචාරය කෙරෙහි බලපෑ ශාස්ත්‍රීය පසුබිම ලිපියේද දක්නට ලැබෙන්නේ කේ. එන්. ඕ. ධර්මදාසගේ ලිපියේම තවත් දිගුවක් ලෙස හැඳින්විය හැකිය. චින්තක රණසිංහගේ 'ගුණදාස අමරසේකර හා පේරාදෙණි ගුරුකුලය' කෘතියේදී සාකච්ඡා කොට තිබෙන්නේ ගුණදාස අමරසේකර පසුකාලීනව පේරාදෙණි සාහිත්‍යය ප්‍රතික්ෂේප කළත්, ඔහුගේ නිර්මාණ ප්‍රශස්ත මට්ටමක පැවති ආකාරයත් පේරාදෙණි සාහිත්‍ය තුළ ඔහු ඉටු කළ භූමිකාවේ වැදගත්කමත්ය. එහිදී අමරසේකර ඩී. එච්. ලෝරන්ස්ගෙන් ලැබූ ආභාසය බෙහෙවින් අගය කිරීමට ලක් කොට තිබේ. චින්තක රණසිංහ ලියූ 'කොළඹ කවියට පේරාදෙණියෙන් එල්ල වූ ඇතැම් විචාරවල අගතිගාමී ස්වරූප (ආරිය රාජකරුණා හා විමල් දිසානායකගේ විචාර ඇසුරින් විමසා බැලීම) ලිපියේදී සිදු කොට ඇත්තේ කොළඹ කාව්‍ය නිර්මාණ පිළිබඳ විමල් දිසානායක හා ආරිය රාජකරුණාගේ විවේචන ප්‍රති විවේචනයකට ලක් කිරීමයි.

එම ප්‍රතිවිවේචනයේදී බටහිර නූතනවාදී හා රොමැන්ටික් ප්‍රවේශය අතර ඇති න්‍යායාත්මක ගැටුම පිළිබඳ කේන්ද්‍රීය අවධානය යොමු කොට තිබේ. මෙම ලේඛන අතර වඩාත් පුළුල් න්‍යායාත්මක විග්‍රහයක් ගැබ් වන්නේ විමල් දිසානායක ලියූ 'Purism Language, and Creativity: The Sri Lankan Experience' නම් ලිපියේය. මෙහිදී දිසානායක විසිවන සියවසේ සිංහල සාහිත්‍ය කතිකාව සමස්තයක් ලෙස ගනිමින් ඒ ඒ කණ්ඩායම්වල දෘෂ්ටිවාද ඔහුන්ගේ ලේඛනවල අන්තර්ගතය, භාෂා ශෛලිය හා විශ්ලේෂණ විධික්‍රම ගවේෂණය කොට තිබේ. එම ගවේෂණයේදී ඔහු සම්ප්‍රදාය, නූතනත්වය, වාග්විද්‍යාත්මක නැඹුරුව යනාදී කාරණා ගණනාවක් මුල්කොට ගනිමින් තම විවරණය ගොඩනගයි. ඒ අනුව සමස්ත සිංහල ලේඛකයන්ගේ දෘෂ්ටිවාද පුළුල් විශ්ලේෂණයකට ලක් වෙයි.

## ක්‍රමවේදය

මෙම ලිපියේ ක්‍රමවේදාත්මක රාමුව (Methodalogical Framework) සඳහා න්‍යායාත්මක ප්‍රවේශයක්ද උපයෝගී කොට ගැනේ, භාවිත කරන දත්ත විශ්ලේෂණය කිරීම සඳහා මෙම න්‍යායාත්මක රාමුව උපයෝගී කර ගැනෙන අතර එය ක්‍රමවේදාත්මක රාමුවෙහිම ඓන්ද්‍රීය කොටසක් ලෙස වර්ධනය කිරීමට අපේක්ෂිතය. මෙම න්‍යායාත්මක ප්‍රවේශයෙහි කේන්ද්‍රීය සංකල්පයක් වන්නේ යම් යුගයක සාහිත්‍ය කලා සංස්කෘතියත් එම සංස්කෘතිය නියෝජනය කරන්නා වූ සමස්ත සංවාදයත් එම යුගයේ ඓතිහාසික සන්දර්භයෙන් මුළුමනින්ම වියුක්තව කළ හැකි නොවන බවත් එම සන්දර්භයේම කොටසක් ලෙස පවතින බවත්ය. මෙහිදී Steven Lynn ගේ Texts and Contexts – Writing about literature with critical theory කෘතියේ ඇතුළත් If history and literature are both texts their literature is potentially as much a context for history as history is for literature (Lynn, 1998: 115) යන අදහසෙන් යම් න්‍යායාත්මක ආලෝකයක් ලබා ගැනේ. එහිදී කියැවෙන්නේ ඉතිහාසය හා සාහිත්‍යය යන දෙකම පඨිතයන් පෙළවල් වියමන් ආදී ලෙසද හැඳින්විය හැකි බවයි. මේ අනුව සාහිත්‍යය ඉතිහාසයටත්, ඉතිහාසය සාහිත්‍යයටත් පසුබිම සපයයි. මේ අනුව යම් තෝරාගත් සමාජයක තෝරාගත් යුගයක සාහිත්‍යය හා ඉතිහාසය අතර

සම්බන්ධය එකිනෙකාට වෙන් කළ නොහැකි වන්නාත් මෙන්ම එසේ වෙන් වෙන් වශයෙන් වටහා ගැනීමද නිරවද්‍ය නොවේ. සාහිත්‍ය කතිකාව විමර්ශනය කිරීම වනාහි සංස්කෘතික ඉතිහාසයේ එන ප්‍රධාන පැතිකඩක් විමසා බැලීමකි. මේ අනුව මේ ලිපියේදී සාහිත්‍යය හා ඉතිහාසය අතර ඓන්ද්‍රිය සම්බන්ධය මෙන්ම සංස්කෘතික ඉතිහාසය යනු යම් යුගයක ඉතිහාසයේම කොටසක් යන මතය මූලික වශයෙන් පිළිගැනේ. මෙම ලිපියේ න්‍යායාත්මක රාමුව එසේ නිර්මාණය වන අතර, දත්ත සපයා ගැනීම සඳහා පුස්තකාල පරිශීලනය පමණක් සිදු කෙරේ.

## සාකච්ඡාව

අර්ථදීපනී (Hermerutics) න්‍යායාත්මක ප්‍රවේශයෙහි අවධාරණ කෙරී ඇත්තේ යම් කෘතියක අර්ථ වටහා ගැනීමේදී එම කෘතිය නිර්මාණය වී තිබෙන සන්දර්භය පුළුල් ලෙස සැලකිල්ලට ගත යුතු බවයි. හුදෙක් අනුභූතික ආකාරයෙන් එම කෘතිය දෙස බලමින් එය විවරණය කිරීම වෙනුවට එහි කතුවරයා, ඔහු හැදී වැඩුණු පරිසරය, එම පරිසරයෙහි එබඳු කෘතියක් නිර්මාණය වීමෙහිලා බලපෑ විවිධ කාරණා යනාදිය කෙරෙහි මෙහිදී ප්‍රබල සැලකිල්ලක් යොමු වෙයි. ලොව කවර රටක, කවර යුගයක, කවර කෘතියක් සම්බන්ධයෙන් වුව මෙම යථාර්ථය උපයෝගී කොටගත හැකිය. එහිදී කෘතිය යන සංකල්පය හුදෙක් පොතකට පමණක් නොව යම් යුගයක් නියෝජනය කරන්නා වූ පුද්ගලයන්, කණ්ඩායම් හා ඒ හා බැඳුණු බොහෝ ප්‍රපංචවලට පොදු යැයි කිව හැකිය.

මෙම ලිපිය සඳහා 1950-1970 යන දශක තුනක කාල පරාසයක් තෝරා ගැනෙන්නේ සාධක කිහිපයක් පදනම් කොට ගනිමිනි. මෙම දශක දෙක ලංකාවේ ප්‍රධාන දේශපාලන පෙරළි දෙකකට සම්බන්ධය. එකක් නම් 1948 දී ලංකාව බ්‍රිතාන්‍ය ආධිරාජ්‍යවාදයෙන් නිදහස ලබා ගැනීමයි. අනික 1956 දී සිදු වූ බලවත් දේශපාලන පෙරළියයි. දහනවවන සියවසෙහි පටන්ම ක්‍රමිකව නිර්මාණය වූ සමාජ දේශපාලන හා සංස්කෘතික බලවේග වඩාත් උච්චස්ථානය වෙත ගමන් කිරීම අරඹන්නේ 1940 පමණ සිටය. එම උච්චස්ථානය භාෂා හා සාහිත්‍ය සංවාදය තුළද විවිධාකාරයෙන් පිළිබිඹු වේ. 1944 දී මිනිස් ජීවිතය

යථා තත්ත්වයෙන් නිරූපණය කළ (වික්‍රමසිංහ, 1956: 484) ප්‍රථම සිංහල නවකතාව ලෙස විචාරක අවධානයට ලක් වූ ගම්පෙරළිය පළ වූ අතර 1946 දී ප්‍රථම වරට සඳසින් තොර ගද්‍යයටත්, පද්‍යයටත් අතර කාව්‍ය නිර්මාණ කිහිපයක්ද සහිතව ජී. බී. සේනානායකගේ පලිගැනීම කෙටිකතා සංග්‍රහය පළ විය. ඒ. එම්. ජී සිරිමාන්න, ජී. බී. සේනානායක හඳුන්වන්නේ "ග්‍රාමක සෞන්දර්යයෙන් හා බොල් භාවෝද්දීපනයෙන් සිංහල කවිය මුදා ගැනීම සඳහා ප්‍රථම පියවර තැබූ කවියා ලෙසයි" (සිරිමාන්න, 1985: 159). කේ. එන්. ඕ. ධර්මදාස පෙන්වා දෙන්නේ 1944 දී ලංකා විශ්වවිද්‍යාලයේ ප්‍රථම සිංහල මහාචාර්යවරයා ලෙස එම්. ඩී. රත්නසූරිය පත් වූ බවත් සිංහල විෂය එතෙක් පැවති පටු සීමාවන්ගෙන් මුදවා පුළුල් පදනමක පිහිටුවීමේ දැක්මක් ඔහු සතු වූ බවත්ය (ධර්මදාස, 2019: 19). 1953 දී අමරදාස වීරසිංහගේ (1926-2018) හා ගනනාථ ඔබේසේකරගේ (1930-2025) පුරෝගාමීත්වයෙන් සංස්කෘති සඟරාව ඇරඹීම සඳහා රත්නසූරියගේ ඉගැන්වීම තමන් වෙත බලපෑ බව වීරසිංහ පෙන්වා දෙයි (වීරසිංහ, 2010: 3-8).

නූතන සාහිත්‍ය ක්ෂේත්‍රයෙහි මෙසේ වඩාත් වැදගත් හා තීරණාත්මක ප්‍රවණතා උද්ගත වීමත් විශ්වවිද්‍යාල පද්ධතියෙහි සිංහල අධ්‍යයන ක්‍රියාවලිය පෘථුල වීමත් මේ යුගයේදී සිදු විය. ධර්මදාස පෙන්වා දෙන්නේ පාලි හා සංස්කෘත භාෂාවල සෙවණැල්ල යටතේ ඉන්දු ආර්ය අධ්‍යයනයට බරව තිබූ සිංහල අධ්‍යයන ක්‍රියාවලිය 1952න් පසු ඩී. ඊ. හෙට්ටිආරච්චි සහ එදිරිවීර සරච්චන්ද්‍රගේ මූලිකත්වයෙන් නූතන සාහිත්‍යය වෙතට නැඹුරු වූ බවත්, 1955 දී විශ්වවිද්‍යාල ප්‍රවේශය හෙවත් ප්‍රාරම්භක විභාගය සඳහා නියමිත කෘති 5න් 3ක් නූතන සිංහල සාහිත්‍යය නියෝජනය කළ බවත්ය (ධර්මදාස, 2019: 42-43). 1956 දී ඇති වූ පෙරළියට සමාන්තරව සිංහල සංස්කෘතිය නියෝජනය කරන බොහෝ අංශවල "පැරණි සම්ප්‍රදායයන් පුනර්ජීවනය වීමේ ක්‍රියාවලිය මතු වූ බව" විචාරක අවධානයට ලක් වෙයි (ධර්මදාස, 2021: 48-49). නාට්‍යය, කවිය, සංගීතය, සිනමාව ආදී කලා ක්ෂේත්‍රයේ විවිධ තල නියෝජනය කරන්නා වූ අංශ මෙම පුනර්ජීවන ක්‍රියාවලියට හසු වී ඇති අතර මෙම තත්ත්වය එකවරම 1956 වසරේදී උද්ගත වූ තත්ත්වයක් නොව දශක ගණනාවක සිට ක්‍රමිකව නිර්මාණය වූ ක්‍රියාවලියක ප්‍රතිඵලයකි. මෙම ක්‍රියාවලිය යම් තීරණාත්මක තත්ත්ව පසු කරන්නේ 1940 පසු උදාවන කාලවකවානුවෙහිය.

සිංහල භාෂාව හා සාහිත්‍යය නූතන ලෝකයෙහි තීරණාත්මක සාධකයක් බවට පත්වීම සඳහා ඒවායෙහි පවතින ව්‍යුහ සිථිල වීම. පොදු ජන අවකාශ තුළ මතවාදී කාර්ය භාර්යයන් ඉටු කිරීම වැනි කොන්දේසි සම්පූර්ණ කළ යුතු වේ. සම්භාව්‍ය සංස්කෘත සාහිත්‍ය කෘති උපයෝගී කොටගෙන කට වහරේ වියරණ රටාව මුල්කොට ගනිමින් පොදු ජනප්‍රිය ආඛ්‍යානයක් ලෙස සකස් කිරීමේ ක්‍රියාවලියේ තීරණාත්මක පියවරක් ලෙස යක්කඩුවේ ප්‍රඥාරාම හිමිගේ වනකතා පොත් පෙළෙහි 1 පළ කළේ 1947 දීය. එහි දෙවන මුද්‍රණය 1958 දී පළ වූ අතර ඒ වන විට එම පොත පාසල් සහ පිරිවෙන්වල පන්ති පොතක් ලෙස උගන්වන්නට පටන්ගෙන ඇති බව (ප්‍රඥාරාම, 2019:) සඳහන් කොට තිබේ. කේයස්ගේ සුදෝසුදු (1943), කාලකන්නියා (1945), විමලරත්න කුමාරගමගේ හපුමලී (1946), බැන්ටිස් රණවීරගේ සාලිය අශෝකමාලා (1952) හා ස්වර්ණතිලකා (1954), මීමන ප්‍රේමතිලකගේ මිනිහා (1943) යනාදී වශයෙන් දෛනික වහර බෙහෙවින් භාවිත කළ කොළඹ යුගයේ දෙවන තරංගයට අයත් පද්‍ය ග්‍රන්ථ රාශියක් බිහිවූයේ මේ යුගයේදීය. කුමාරතුංග මුනිදාසගේ නායකත්වයෙන් යුතුව සම්භාව්‍ය ව්‍යාකරණ රීති හා සම්ප්‍රදායන් පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපාරයක් පැවති නමුත් කථා ව්‍යවහාරය හා ලිඛිත ව්‍යවහාරය දෙකම සම්මිශ්‍රිත ලෙස ගෙන මධ්‍යවර්තී ස්වරූපයෙන් සිංහල ව්‍යවහාරයට ගත යුතුය යන අදහස දැරූ එච්. ඇස්. පෙරේරා වැනි අයගේ ප්‍රමුඛත්වයෙන් යුත් පිරිසක්ද මෙම යුගයේ මතු වූ බව පෙනේ (ධර්මදාස, 2021: 40). මේ යුගයේ සිංහල ප්‍රබන්ධය, ජනමාධ්‍ය, කාව්‍ය රචනය වැනි දේවල් මහජන පරිමණ්ඩලය (Public Sphere) ගොඩනැගීමෙහි ලා ඇති කළ ප්‍රබල බලපෑම විමල් දිසානායකගේ අවධානයට ලක් වෙයි (Dissanayake, 2009: 55-101). එක් අතකින් කොළඹ නගරය කේන්ද්‍ර කොට ගනිමින් කොළඹ කවින් හා ජනමාධ්‍යවේදීන් සංස්කෘතික කටයුතුවල නිරත වෙද්දී 1951න් පමණ පසු පේරාදෙණිය සරසවිය කේන්ද්‍ර කොට ගනිමින් නූතනවාදී නව සිංහල සාහිත්‍යයක්ද නිර්මාණය වූ ආකාරය නිරීක්ෂණය කළ හැකිය. 1955 දී භාව ගීත හා 1956 දී මස් ලේ නැති ඇට පළ වීමත් 1951 දී Modern Shinhalese Fiction කෘතියෙහි සිංහල පරිවර්තනය පළ වීමත් සමග පේරාදෙණි කතිකාව සැලකිය යුතු න්‍යායාත්මක පදනමක් සහිතව වර්ධනය වීම ඇරඹිණි. 1945 දී සාහිත්‍ය විද්‍යාව කෘතියත්, 1958 දී කල්පනා ලෝකය කෘතියත්, පළ වීමෙන් සාහිත්‍යය පිළිබඳ නව මානයකින්

සිතීමේ හැකියාව වර්ධනය වූ අතර 1959 දී විද්‍යෝදය හා විද්‍යාලංකාර පිරිවෙන විශ්වවිද්‍යාල බවට පත්කිරීමත්, 1945 දී ආරම්භ කළ අධ්‍යාපන මාධ්‍ය ස්වභාෂාවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය 1956 දේශපාලන බල පෙරළියත් සමග ශීඝ්‍ර වශයෙන් ව්‍යාප්ත වීමත් 1940 සිට ඉදිරි කාල පරිච්ඡේදය ලාංකේය සංස්කෘතික හා බුද්ධිමය කටයුතු සම්බන්ධයෙන් අතිශයින්ම වැදගත් කාල පරිච්ඡේදයක් ලෙස සැලකිය හැකිය. හතළිහ දශකයේ සිටම පිරිවෙන සම්ප්‍රදායෙහි පවා නූතන සාහිත්‍යය පිළිබඳ අනන්‍ය වූ කියවීමක් වර්ධනය වූ ආකාරය නිරීක්ෂණය කළ හැකිය. සම්භාව්‍ය සාහිත්‍යය පිළිබඳ ප්‍රමාණික උගතෙකු මෙන්ම විද්‍යාලංකාර පිරිවෙනෙහි ශාස්ත්‍රඥයකු වූ කොටහේනේ පඤ්ඤාකිත්ති හිමි ලියා පළ කළ සාහිත්‍යය හා සමාජය මේ සඳහා කදිම උදාහරණයකි. එම පිරිවෙනෙහිම වැඩ විසූ ප්‍රමුඛ උගතෙකු වන බඹරැන්දේ සිරි සීවලී හිමියන් යක්කඩුවේ ප්‍රඥාරාම හිමි ඇරඹූ ලිහිල් භාෂා ප්‍රතිපත්තිය නූතන ලෝකයට අවශ්‍ය ආකාරයෙන් වර්ධනය කරමින් ලියන කලාව, කථා කලාව ආදී වශයෙන් පොදු පාඨක ප්‍රිය ශෛලිය නිර්මාණය කෙරෙන පතපොත රාශියක් ලියා පළ කළ අතර ඔහු විදේශීය සම්ප්‍රදායයන්ගෙන් ලත් ආභාසය පිළිබඳව සාකච්ජාවට ලක් වී තිබේ (රණසිංහ, 2011: 100-125). විද්‍යෝදය පිරිවෙනෙහි පුරෝගාමී බුද්ධිමය ක්‍රියාකාරිකයා ලෙස සැලකෙන වැලිවිටියේ සෝරත හිමිද (1897-1963) ද, මේ යුගයේ සිංහල පතපොත විශාල වශයෙන් පළ කළ අතර සාම්ප්‍රදායික භාෂා ව්‍යවහාරය පොදු ජන රුචියට අනුකූල ලෙස වෙනස් කරමින් බටහිර සාහිත්‍යය පිළිබඳව ද අවධානය සිංහල පාඨකයා වෙත යොමු කිරීම සඳහා ඔහු ගත් ප්‍රයත්නය විචාරක අවධානයට ලක්ව තිබේ (Ranasinha, 2016: 385-397).

හෙළ හවුලේ පුරෝගාමී පඬිවරයා ලෙස සැලකෙන කුමාරතුංග මුනිදාස (1887-1944) 1944 දී අභාවයට පත් වුවත්, රැ. තෙන්නකෝන් (1899-1965), අලවුඉසි සැබිහෙළ, දා. දු. න. වීරකෝන්, අරිසෙන් අහුබුදු (1920-2011) ඇතුළු හෙළ හවුල නියෝජනය කළ ලේඛකයන් හා පඬිවරුන් නව නිර්මාණාත්මක හා විචාර ලේඛන ඔස්සේ සිංහල සාහිත්‍ය කතිකාව පෝෂණය කරන ලද ආකාරය නිරීක්ෂණය කළ හැකිය. කේ. එන්. ඕ ධර්මදාස පෙන්වා දෙන්නේ පේරාදෙණි සරසවියේ සිංහල අංශයේ ස්වර්ණමය යුගය 1950-1970 දක්වා සැලකිය යුතු බවයි (ධර්මදාස, 2019: 56). ඔහු එයට හේතු වශයෙන්

ඍජුව නිශ්චිත කාරණයක් කේවල ලෙස ගෙනහැර නොපාන නමුත් ඔහුගේ ලිපියෙන් ධ්වනිත වන්නේ මෙම යුගයේ ඇති වූ ජාත්‍යන්තර ශාස්ත්‍රීය පරිචයක් සහිත පර්යේෂණාත්මක ක්‍රියාවලිය ප්‍රමුඛ කොට ගනිමින් මෙම අදහස පළ කරන්නට ඇති බවයි. මේ අනුව 1950-1970 යන දශක දෙක සිංහල සාහිත්‍ය කතිකාවෙහි සුවිශේෂ පිබිදීමක් හා ප්‍රවණතා නිර්මාණය කළ දශක දෙකක් ලෙස හැඳින්වීමේ සාධාරණ හේතු ගණනාවක්ම ඉදිරිපත් කෙරී තිබේ.

සම්භාව්‍ය සිංහල සාහිත්‍ය සම්ප්‍රදාය නියෝජනය කළ ඇතැම් කතුවරුන් සාහිත්‍ය කෘති රචනා කරමින් තමා මෙන්ම තමා නියෝජනය කළ ආයතනය හෝ ගුරුකුල කණ්ඩායම් සඳහන් කළ බව පෙනේ. තොටගමුවේ ශ්‍රී රාහුල හිමියෝ කාව්‍යශේඛරය අරඹමින් "විජයබා පිරිවෙන කියන බණ මේ අසව් සතොසින" යනුවෙන් පැවසූහ. කාව්‍යශේඛරය රචනා කළ කර්තෘ වශයෙන් තමාගේ නම එක් ස්ථානයක වෙනම සඳහන් කළ නමුත් විජයබා පිරිවෙණ කියන බණක් ලෙසද කාව්‍යශේඛරය හඳුන්වාදීමට උන්වහන්සේ පෙළඹුණු සේක. එයින් පෙනෙන්නේ මධ්‍යකාලීන යුගයේ පවා ආරාමික නිර්මාණ සම්ප්‍රදායෙහි නිර්මාණයක් බණ කෘතියක් ලෙස හැඳින්වීමේ ප්‍රවණතාවක් පැවැති බවයි. කොළඹ කවියේ ආරම්භය හා එයට මුල් වූ මාතර කවියෙහි අවසාන භාගය අතර විචාරකයන් සමීප සම්බන්ධතාවක් දකින අතර ඒ අනුව නිරන්තරයෙන්ම නූතන සාහිත්‍ය න්‍යාය හා මධ්‍යකාලීන සාහිත්‍යය අතර අඛණ්ඩ සම්බන්ධයක් නිර්මාණය කරලීමේ උනන්දුව බොහෝ වියතුන් ළඟ තිබූ බව නිරීක්ෂණය කළ හැකිය (සිරිවර්ධන හා විජේසූරිය, 1987: 4-81). කොළඹ කවිය ජාතික ව්‍යාපාරය තුළ උපන් සාහිත්‍ය ව්‍යාපාරයක් ලෙස දකින විටත් සිංහල කෙටි කතාව සම්භාව්‍ය ගද්‍ය සාහිත්‍යයේ ම විකාසනයක් ලෙස දකින විටත් එමඟින් ධ්වනිත වන එක් ප්‍රධාන කාරණයක් වන්නේ නූතන සිංහල සාහිත්‍ය කතිකාවෙහි සම්භාව්‍ය සිංහල සාහිත්‍ය කතිකාව තුළ නොමැති 'නූතන' ලක්ෂණ ඇති වුවත් මෙහි පවතින්නේ අනාදිමත් කාලයක සිට පැවතෙන සිංහල සාහිත්‍ය කතිකාවේම අඛණ්ඩ දිගුවක් බවයි. පේරාදෙණි ගුරු කුලයට සහ එහි සාහිත්‍ය මතවාදවලට එරෙහිව ප්‍රබල උපහාසාත්මක හා අපහාසාත්මක විවේචන රැගෙන ආ වංශනාථ දේශබන්ධු වැනි ලේඛකයෙකු තම සාහිත්‍ය කොල්ලය නම් කෘතියේදී මෙම කාරණය බෙහෙවින්ම අවධාරණය කරයි. ඔහු තම ග්‍රන්ථය ආරම්භ කරන්නේම,

සදාචාරය නමැති අත්තිවාරම උඩ සිංහල සංස්කෘතිය නිර්මාණය වූ බවත්, එය වසර දහස් ගණනාවක් තිස්සේ බුදු සමයෙන් හික්මුණු බවත් කියමිනි (දේශබන්ධු, 1961: 11). මේ අනුව සිංහල සාහිත්‍යය යනු රට, ජාතිය, ආගම, හා සංස්කෘතිය සමඟ ඓන්ද්‍රියබද්ධ ලෙස බැඳුණු ප්‍රපංචයක් බව ඔහුගේ දැඩි නිගමනය විය. මීට ප්‍රතිපක්ෂව පේරාදෙණි සාහිත්‍ය විචාර ග්‍රන්ථවල දක්නට ඇත්තේ සාහිත්‍යය හා කලාව ජාතික උරුමය හා සංස්කෘතික උරුමය වැනි සාධක සමඟ සම්බන්ධ කොට වටහා ගැනීමේ ප්‍රයත්නයක් නොව හුදු ස්වාධීන ප්‍රපංචයක් නැතහොත් විෂයක් ලෙස හඳුනා ගැනීමේ උත්සාහයකි. 1951 දී සිංහලට පරිවර්තනය කළ ප්‍රථමයෙන් 1943 දී Modern Sinhalese Fiction යනුවෙන් එදිරිවීර සරච්චන්ද්‍ර ලියා පළ කළ විචාර ලේඛනය නූතන සිංහල සාහිත්‍යය නමැති විෂය වස්තු කොට ගනිමින් රචිත ප්‍රථම විධිමත් විචාර ලේඛනය ලෙස හඳුනාගැනීමේ වරදක් නැත. මෙම ලේඛනයේදී සරච්චන්ද්‍ර ගෙන ඒමට තැත් කරන ප්‍රධාන තර්කයක් වන්නේ පියදාස සිරිසේන, ඩබ්ලිව්. ඒ. සිල්වා ප්‍රමුඛ ප්‍රබන්ධකරුවන් ඉක්මවා මාර්ටින් වික්‍රමසිංහ යථාර්ථවාදී සිංහල නවකතාකරුවා ලෙස මතු කිරීමේ අවශ්‍යතාවයි. සරත්චන්ද්‍ර, මාර්ටින් වික්‍රමසිංහගේ කෙටිකතා සංග්‍රහයක්ද තම හැඳින්වීමක් සහිතව පළ කොට තිබූ අතර, එහිදීද ඔහු යථාර්ථවාදී ස්වතන්ත්‍ර රචකයකු ලෙස වික්‍රමසිංහ පළ කරන ප්‍රතිභාව අගයමින් සෙසු සමකාලීන ලේඛකයන්ගෙන් වෙනස් අනන්‍යතාවක් සහිත යථාර්ථවාදී නිර්මාණකරුවා මාර්ටින් වික්‍රමසිංහ යැයි පෙන්වා දුන්නේය. හෙළ හවුල හා කොළඹ කවීන් යන කණ්ඩායම දෙකෙහිම සැලකිය යුතු බුද්ධිමය ආශිර්වාදයක් මේ වන විට හිමිකරගෙන තිබුණේ ඩබලිව්. ඒ. සිල්වාය. සිල්වාගේ ප්‍රබන්ධවල නිරූපණය වන රොමැන්ටික් මිනිස් සබඳතා සහ කොළඹ කවියේ රොමැන්ටික්වාදී ප්‍රවණතාව අතරද පැවති යම් සමාන බවක් නිසා එම තත්ත්වය උද්ගත වූයේදැයි කිව නොහැකි නමුත් එබඳු සාහිත්‍යමය සබඳතා පැවතුණි. සිල්වා ප්‍රධාන චරිතය ලෙස නිරූපණය වන සිල්වාගේ නවකතාවල ජනප්‍රියත්වය ඇඟවෙන කුඩා කථා පුවතක් කොළඹ යුගයේ දෙවන තරංගය නියෝජනය කරන පි. බී. අල්විස් පෙරේරා (1917-1966) කවියට නගා තිබුණි. උඩරට පිහිටි තම තේ වතු බැලීමට කොළඹින් පිටත් වන රාත්‍රී දුම්රියේ නිදන මැදිරියේ යන සිල්වාට ඉක්මනින් නින්දට යැමට අවශ්‍ය වෙයි. එහෙත් එම මැදිරියේම සිටින ඔහුගේ මැදිරි සහකරුවා දිගින් දිගටම පොතක් කියවීමත්, ඒ නිසා විදුලි බල්බය නිවා දැමීමට

නොහැකි වීමත් අර්බුදයක් ජනිත කරයි. වාර්තාගත වන ආකාරයට මේ උනන්දු සහගත පාඨකයා රෙදි බැනියම් අඳින උඩරටින් කොළඹ පැමිණ පෙරළා තම නිවසට යන උඩරට මුදලාලි කෙනෙකි. සිල්වා විදුලි බල්බය නිවා දැමීමට සැරසෙන විට මෙම උඩරට මුදලාලි පාඨකයා පවසන්නේ කලිසන්කාරයන්ට හොඳ සිංහල පොතක් රස විඳ ගැනීමට නොහැකි වීම පුරුවේ පවක් බවත්, මේ පොත කියවා මිස තමාට නින්දට යා නොහැකි බවත්ය. මෙය පි. බී අල්විස් පෙරේරා කවියාට නගා ඇත්තේ පහත ආකාරයෙනි.

"කලිසන් කාරයන් හට සිංහල පොතක
රස විඳගන්ට බැරි එක පූරුවේ පවක
මහත්තයෝ මේ පොත කියවා මීසක
කොයි හැටි වෙතත් නිදියන්නට නම් නොහැක"

අසීමිත උනන්දුවක් සහිත මේ පාඨකයාගෙන් සිල්වා අසන්නේ ඔබ කියවන මේ පොත කුමක්ද කියාය. එවිට ලැබෙන පිළිතුර වන්නේ මේ පොත 'හිඟන කොල්ලා' යන්නයි. එවිට සිල්වා නිහඬව තම අසුනේ වැතිරුණු බව අල්විස් පෙරේරා කවියට නගා ඇත. හෙළ හවුලට සම්බන්ධ ලිපි ලේඛනවලින් කියැවෙන්නේ කුමාරතුංග මුනිදාස හා ඔහුගේ හෙළ හවුල් හිතවතුන් ශාස්ත්‍රීය සාකච්ඡා සඳහා මෙන්ම විනෝදය සඳහාද මුළුගැන්වුණු අවස්ථාවල ඩබලිව්. ඒ. සිල්වාටද එම අවස්ථාවන් විවර වූ ආකාරයයි. මේ සමස්තයෙන් පැවසෙන්නේ කොළඹ කවිය, සිංහල පුවත්පත් කලාව හා හෙළ හවුල වැනි කණ්ඩායම් එක් පාර්ශ්වයක් ගත් අතර පේරාදෙණිය ගුරු කුලය පමණක් සාහිත්‍යය හා එහි භාවිතය සම්බන්ධයෙන් වෙනස්ම අනන්‍යතාවක් සහිත ස්ථාවරයක් ගත් ආකාරයයි. ඩබලිව්. ඒ. සිල්වාගේ විජයබා කොල්ලය වැනි පාඨකයන් අතර මහත් සේ ජනප්‍රිය වූ ප්‍රබන්ධ කතා පිළිබඳ පේරාදෙණි සරසවිය කේන්ද්‍ර කොටගත් උගතුන්ගෙන් ප්‍රබල විවේචන එල්ල වූ ආකාරය සරච්චන්ද්‍ර වික්‍රමසූරිය ලියූ විජයබා කොල්ලය විවරණය (1963) වැනි කෘතිවලින් පැහැදිලි වේ. සරච්චන්ද්‍ර වික්‍රමසූරිය මෙහිදී ඩබ්ලිව්. ඒ. සිල්වා පිළිබඳව එදිරිවීර සරච්චන්ද්‍ර ඉදිරිපත් කළ අදහස් තවදුරටත් විග්‍රහාත්මකව තහවුරු කරන ආකාරය නිරීක්ෂණය කළ හැකිය. සාහිත්‍ය විචාරයෙහි ලා හෙළ හවුල පිළිගත් මග තෙන්නකෝන්ගේ 'අපේ කවි' (1957) කෘතියෙහි පෙරවදන විමසා බැලූ විට හඳුනාගත හැකිය. එහිදී සමකාලීන සාහිත්‍ය

විචාර න්‍යාය හා භාවිතය විචාරයට ලක් කරමින් තෙන්නකෝන් පවසන්නේ "හෙළ පබද ආර, හෙළ වදන් නියර හා සැබැවි හෙළ බව අනුගමනය කළ යුතු බවත් හෙළ කවියකුගේ පබඳ විමසීම සඳහා පිළිනි වූ ඉංගිරිසි වීමසීම් නියාය යොදා ගැනීම හාස්‍යයට කරුණක් බවත්ය" (තෙන්නකෝන්, 1957: xvi). හෙළ පබඳ ආර යන්නෙන් සිංහල ප්‍රබන්ධ ක්‍රමයද හෙළ වදන් නියර යන්නෙන් සිංහල වචන පිළිබඳ රීතියද, සැබැවි හෙළබව යන්නෙත් සැබෑ නැතහොත් අව්‍යාජ (Authnetic) සිංහල බවද අර්ථ ගැන්වූ බව පෙනේ. එහෙත් තෙන්නකෝන් මෙහිදී මෙම සංකල්ප වෙන වෙනම ගෙන නිර්වචනය කරමින් උදාහරණ සහිතව ගෙනහැර පාන බවක් නොපෙනේ. එමෙන්ම තෙන්නකෝන් මෙහිදී තවදුරටත් මෙම සාකච්ඡාව ඉදිරියට ගෙනයමින් පෙන්වා දෙන්නේ හෙළ කවියෙකුගේ පබඳ විනිසීමට පිළින වූ ඉංගිරිසි විවිසීම් නියාය ගැනීම මෙරට මිනිසුන්ට සිනා උපදවන කාරණයක් බවයි (තෙන්නකෝන්, 1957: xvi) තෙන්නකෝන්ගේ යථෝක්ත අදහස් විමසා බලන විට පෙනී යන්නේ මේ ඔහුගේ විවේචනයට ලක්වන්නේ එම යුගයේ ලංකා විශ්වවිද්‍යාලය මඟින් සිංහල භාෂා සාහිත්‍ය කතිකාව වෙතට රැගෙන ආ නිර්මාණ හා විචාර සම්ප්‍රදාය බව පැහැදිලිය. විසිවන සියවසේ දෙවන දශකයේ පමණ එංගලන්තයේ වර්ධනය වී පසුව ලොව පුරා ශීඝ්‍රයෙන් පැතිරී ගිය Practical Criticiasm (මෙය ප්‍රායෝගික විචාරය නමින් ඇතැම් විද්වතුන් සිංහලයට පරිවර්තනය කරන ලද අතර තවත් ඇතැම්හු භාවිත විචාරය යන නමින් සිංහලයට පෙරළෙති.) නම් විචාර මතවාදය ඊ. එෆ්. සී. ලුඩොවයික් (1906-1985) වැනි ලංකා විශ්වවිද්‍යාලය නියෝජනය කළ උගතුන් විසින් ඉංග්‍රීසි අංශය තුළ රෝපණය කළ ආකාරයත් පසුව එය සිංහල පාඨක ප්‍රජාව අතරද ප්‍රකට වූ ආකාරයත් විචාරකයන්ගේ අවධානයට ලක් වී තිබේ (වීරසිංහ, 2012: xvii-xvii). පනස් ගණන් වන විට ලංකා විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි අංශයෙහි මෙය බලවත්ව පැවැති අතර සාම්ප්‍රදායික පෙරදිග විචාර කලාව දිගු කාලීනව පුහුණු කළ සිංහල පාඨකයාට මෙය නව මානයක් විය.

තෙන්නකෝන් මෙහිදී "පිළින වූ ඉංග්‍රීසි නයක්" ලෙස අර්ථ ගන්වන්නේ මෙම විචාර සංකල්පය බව පැහැදිලිය. තවද තෙන්නකෝන්ගේ 'අපේ කවි' ග්‍රන්ථයේ "සරසවි නාඩගමේ අගතැන්පත් වූ සූත්‍රධාරියකු" ලෙස සඳහන් වන්නේ එදිරිවීර සරච්චන්ද්‍ර (1914-1996) බව පැහැදිලි වේ. 1951 දී නූතන සිංහල නවකතාව හා විචාරය කෘතිය

පළවීමත් සමග නවකතාව විචාර ක්ෂේත්‍රයෙහි සරච්චන්ද්‍ර සතු වූ අසහාය බලය තෙන්නකෝන් ලියූ පහත ඡේදයෙන් පැවසේ.

> "සරසවි නාඩගමේ අගතැන්පත් සූත්‍රධාරියෙකු විසින් ඔවුන් නවකතා යන්නෙන් සඳහන් කරන පබඳ වෙසෙසවීමට ලක් කෙරෙමින් ගෙතූ පොතක් මට දක්නට ලැබිණි. ඒ දුටු හැටියේ සිහි වූයේ අපේ රාජපඬිතුමාගේ තුතිපත් මිටියයි. රාජපඬිතුමා වනාහි එකක් රුපියල් දහය ගණනේ ඕනෑ පමණක් තුතිපත් ගොතා දීමේ යෙදී සිටි තැනැත්තෙකි. පැයක් තුළදී තුතිපත් විස්සක් තිහක් එතුමා පබඳ කරයි. එතුමාගේ තුතිපත් සියල්ලම එකෙකි. ඒ එක එකේ ඇති වෙසෙස නම් තුති පැසසුම් ලබන පතියන්ගේ නම් වෙනස් කොට යොදා ඇති බව පමණයි, 'අලග ක් කෝනාර හිමිසඳ දිනෙ මෙපුර' යන්නෙහි අලගක් කෝනාර හිමිසඳ යන්න වෙනුවට 'වීරක්කොඩි මැතිඳු සඳ', 'සමරක් කොඩි මැතිඳු සඳ', 'වීරප්පෙරුම මැති සඳ' ඈ විසින් අවැසි පරිදි වෙනස් කිරීමත් 'මෙපුර' යන්න වෙනුවට 'සහ සොඳුර' යන්න යෙදීමක් පමණයි අපේ රාජ පඬිතුමමමා කරන්නේ (තෙන්නකෝන්, 1957: xvi-xvii).

'රාජපඩිතුමා' ලෙසින් සරච්චන්ද්‍රගේ විචාර භූමිකාව මෙහිදී අර්ථ ගන්වා තිබේ. මෙය මුළුමනින්ම සරච්චන්ද්‍රගේ විචාර භූමිකාවෙහි තිබූ ඓතිහාසික තත්ත්වය හඳුනා නොගැනීමකි. පේරාදෙණි විචාර කලාව මතු නොව පේරාදෙණි කවිය හා කාව්‍ය මාර්ගයද හෙළ හවුලේ ලේඛකයන්ගේ දෘඪතර විවේචනයට හසු වූ ආකාරය මැනවින් පැහැදිලි කරන්නකි, 1962 දී පළ වූ දා. දු. න. වීරකෝන්ගේ 'රිවිඳුරුනා ටකුර කිවිඳුන්ගේ සුදාව' නම් කෘතිය. (වංග මහා කවි රවීන්ද්‍රනාත් තාගෝර්ගේ (1861-1941) කෙටිකතා සමුච්චයක සිංහල පරිවර්තනයක් ලෙස මෙම පොත පළ වී තිබේ.) රවීන්ද්‍රනාත් තාගෝර් යන දෙවදන හුදු හෙළ වහරට පෙරළා තිබෙන්නේ 'රිවිඳුරුනා ටකුර' යනුවෙනි. මෙම පරිවර්තිත කෙටිකතා සංග්‍රහයට විවිධ නම්වලින් හැඳින්වීම් කිහිපයක්ම රචනා කොට තිබෙන අතර එම පෙරවදන් රචනා කොට තිබෙන්නේ හෙළ හවුල නියෝජනය කළ ප්‍රමුඛයන් වූ දි. වී. රිචඩ් ද සිල්වා, ආර්යදාස කුමාරසිංහ හා දා. දු. න. වීරකෝන් විසිනි. ඒ අතර

දා. දු. න. වීරකෝන් රචනා කළ හඳුනවුව නම් ලිපිය පිටු xvii සිට xlvi දක්වා විහිදෙන දිගු ලිපියක් වන අතර එහි සමකාලීන සිංහල සාහිත්‍යයේ විවිධ ප්‍රවණතා ආදිය සාකච්ඡා කරන අතර පේරාදෙණි කවියටද කර්කශ විවේචනයක් එල්ල කළ ලිපියක් ලෙස පෙන්වා දිය හැකිය. ගුණදාස අමරසේකර හා සිරි ගුනසිංහ යන දෙදෙනාම පොදුවේ පේරාදෙණි නිසඳැස් කවියන් ලෙස නාමකරණය කළ ආකාරය මෙම විවේචනයේ කැපී පෙනෙන අදහසකි. එසේම සමස්ත පේරාදෙණි සාහිත්‍යයම මෙහිදී හඳුන්වා ඇත්තේ 'හඩුබසින්' ලියවුණු සාහිත්‍යයක් ලෙසය. පේරාදෙණි නවකතාවට කර්කශ විවේචනයන් එල්ල කිරීමෙන් පසු පේරාදෙණි කවිය විවේචනය කිරීමට බසින දා. දු. න. වීරකෝන් එම විවේචනය අරඹන්නේ මෙසේය.

> "හඩු බස් පිළේ ඇත්තන්ගේ නව පැදි මගෙක් ද වෙයි. 'නිසඳැස' නම් යැ ඒ. විරිතකට අනුවැ පද කිහිපයක් රසවත් වැ ගළපා ගන්නට නොසමත් වූ මේ දුඹුලෝ 'නිසඳැස' කොල් ම ඇඳ හෙළ පැදිය කිළිටි කළ හ. නිකම් වදන් ගොඩක් නිසි පිළිවෙළක නැති වැ පේළියෙන් පේළියට ලිවීම යි ඔවුන්ගේ මේ හපන්කම. පැරණි හෙළ කිවියන් ගේ කිවියාව මේ නිසඳැස් කවියට යට වන බව ඔහු මැ කියති; ලියති. අද මේ දිවේ සිටුනා නවීන සිංහල කවියන් දෙදෙන කවුරුන් දැයි ඔබ දනිති ද?" (වීරකෝන්, 1962: xxvi).

පැරණි හෙළ කිවියන්ගේ කවිත්වය (කිවියාව) මෙම නිසඳැස් කවියට යටවන බව විචාරකයා මෙහිදී උපහාසයෙන් පෙන්වා දෙයි. මෙහි ඔහු යන්න යොදා ඇත්තේ හෙළ හවුලේ සම්ප්‍රදායට අනුව බහු වචන අර්ථය ලබාදීමටයි. මෙහිදී 'ඔහු' යනුවෙන් මෙම විචාරකයා හඳුන්වන්නේ ගුණදාස අමරසේකර හා සිරි ගුනසිංහ යන දෙදෙනාය. හඩු පිළ යනු පේරාදෙණි ගුරුකුලයයි.

විචාරකයා මෙහිදී තම විචාරයට ලක් කරන්නේ ගුණදාස අමරසේකරගේ ප්‍රකට පැදි පෙළක් වන 'වැස්ස' නම් පැදි පෙළයි. ඔහු විචාරය අරඹන්නේ මෙසේය:

> "මේ නවීන මහ කයියන්ගේ කෙරුමෙකැ හැටි! 'නවීන මහ කවි' ගුණදාස අමරසේකරයන් ගේ 'වැස්ස' නම් හිසින් ලියැවුණු ඉතා කෙටි පබඳ මෙහි ලා විමසමු.

'චිච්රි චිරි චිච්රි චිරි උදේ සිට ඇද හැලෙන
පොද නොකැඩී තෙත බරව හිරි කිතෙන් කිලිපොලන
පාර තොට ගහ කොල ද, වසාගෙන හැම අතින
වහින වැහි වහින වැහි නො පායන මුළු දවස.'

මුල් පාද තුනෙන් මැ කියවෙන දෑ වහින වැසි යන්නට වෙසෙසුන් වෙයි. එක එක ගෙනැ වීමසමු. 'උදේ සිට ඇද හැලෙන වහින වැහි' ඒ අමුතු වැහි ජාතියක්. ඔබ අසා ඇති ද 'ඇද හැලෙන වහින වැහි' ගැනැ? ඇද හැලෙන-වහින යන දෙ වදනේ අරුත් නොදත් මහ කයියා! එපමණ ද, 'තෙත බරිව වහින වැහි', 'හිරි කිතෙන් කිලිපොලන වහින වැහි', 'ගහ කොල ද වසාගෙන හැම අතින් වහින වැහි', 'මුළු දවස නොපායන වහින වැහි' ඉගෙන ගන්න ඔබත් නන'යුරු වැහි. මං පෙත් ගස් වැල් තෙමා ගෙනැ, සීතල ද දනවමින්, දවස පුරා නො නතර වැ වැස්ස සැටි කියන්නට පද විකර කොටැ තිබෙන සැටි!

'ගොහුරු මඩ ඇඟිලි කරු අතර චිරි චීරි ගාන
මඩ කඩිතිහැම තැන ම මඩ පාට දිය රැඳුණු
අලුත් පස් දැමූ පාර දනිහ තෙක් මඩ
එරෙන බැනියම ද ඇඟට ඇලී උදේ සිට තෙත බරිව'

මේ නිකම් මැ වදන් ගොඩක් විනා අරුතක් දැක්වෙන්නෙක් ද? වැසි දිය වැටීමෙන් පොළව මඩ වෙයි. එවිට දිය මඩේ පාට ගනියි. මේ විනා මඩ කඩිතිවල රැඳෙන මඩ පාට දිය වෙසෙසෙක් වේද? අලුත් පස් දැමූ පාර වැසි දියෙන් මඩ වැ, එහි දණ තෙක් එරෙන බව කියන්නට ගොස් කළ විකාරයෙකැ සැටි! 'මඩ එරෙන' යනුද කිළිටි යැ 'බැනියම' තෙත් වන තුරු උදේ සිට මැ වැස්සට තෙමුණු මේ මිනිහා පිස්සෙක් ද?

'තෙමුන රෙදි ඇඟ ඇලුන හබුරු කොළ මලිපිටි ද
දෝරගොස් හැම තැන ම වක්කලන් ඇලි හැඳුන
හැට්ට අත් කඳ කලව තෙත රෙද්ද ඇඟ එතුව
වහින වැහි තද සුළඟ නො පායන මුළු දවස'

මොනව ද මේ ඇඟෑ ඇලුන හබුරු කොළ මලිපිටි? කලින් බැනියමක් ඇද සිටි මෙ මිනිහාට හැට්ට අත් ලැබුණේ කා ගෙන් ද? හැට්ට අත්, කඳ කලව, තෙත රෙද්ද ඇගේ එතෙන්නේ කෙසේ ද? මේ අත් කඳ කලවා හැට්ටයේ අත් කඳ කලවා ද? නැත්තම් බැනියමින් හැට්ටයට මාරු වූ එකාගේ අත් කඳ කලවා ද? මුල් පද තුනේ හා සිවු වැනි පදයේ හා ඇති සබඳ කෙතෙක් ද? 'නො පායන තද සුළඟ' මේ උතුරු කුරු දිවයිනේ සිංහල ද? නෑ නෑ පේරාදෙණිය සිංහල! අනේ! මේ නිවට නිසඳැස් කයියන් සිංහලයට කරන විපතකෑ හැටි!"

මෙම විචාරයෙන් පෙනී යන්නේ හෙළ හවුලේ විචාරකයා තම විචාරයේදී බෙහෙවින් විචාර නිර්ණායක ලෙස සලකා ඇත්තේ පද සම්බන්ධය සහ ඒ මඟින් අර්ථ ජනනය වීම නම් කාරණය බවයි. ගැමි වහර, කට වහර භාවිතය ඔස්සේ නගින ධ්වනිය වෙත ඔහුගේ අවධානය යොමුකර නැති අතර ඒවායේ අර්ථ ජනනීය ශක්‍යතාව පිළිබඳව හෙළ හවුල් විචාරකයා කිසිදු අවධානයක් යොමුකොට නොමැත. "නිවට නිසඳැස් කයියන්, පේරාදෙණි සිංහල" වැනි වදන් යම් අපහාසාත්මක බවක් මිස තර්කානුකූල විචාරයක් ගෙන එතැයි සිතිය නොහැක. අර්ථ නිරවුල් කර ගැනීමට නොහැකි පද ගැළපුම මෙහිදී 'වැස්ස' කාව්‍යයේ අසාර්ථකත්වය සඳහා තුඩු දෙන මූලික කාරණය ලෙස සලකා තිබේ.

මීළඟට දා. දු. න. වීරකෝන්ගේ විචාරය සිරි ගුනසිංහ වෙත එල්ල වන බව පෙනී යයි. සිරි ගුනසිංහගේ කවිවල කොටස් විමසමින් ඔහු ගෙනා විචාරය මෙසේය:

"මඳ විවර අදරින් අදර
වැලැඳින අඳුරින්
අඳුරු සෙලුවෙන් සෙලුව
සිසිල් හල කිහිරකට පමණ
ඉඩ කොද මිරිකී මොහොත මසින් මස මැනික,
ඔබ දෙ තොල නොවතල අඟලකදු මා සිරුර කොද?

අඹු සැමි යුවළකගේ සමහම් සමාගමයෙකැදී අදරින් අදර. සෙලුවෙන සෙලුව වැලැඳෙන බව සැබෑ ය. අඳුරින් අඳුර එක්වන්නේ කවර පෙළහරෙකින් ද? කාගේ අඳුරින්

අඳුර ද මේ වලඳින්නේ? එක් එක් අයට හිමි අඳුර කැටි තිබේද? දුඹුල් බස් වහරෙක මහිම ය නො පෙනේ ද?

'මසින මස මිරිකි මොහොතේ, සිහිල් නල කිහිරකට පමණ ඉඩ කොද' මෙයින් හැඟෙන්නේ උණුසුම් නල 'කිහිරකට' ඉඩ ඇති බව යි. ඇයි උණුසුම් නල යන තැනින් සිහින් නලට යන්නට බැරි? 'සිහිල්' යන පදය මෙහි අවුලක් මතු කළ සේ යැ.

අවසන් දෙ පදය කියවැන්නැ. ඇගේ දොතොල නො වතළ අසලකුදු ඔහුගේ සිරුරේ නැතිලු, තවර කවර තැන් දෙතොලින් පිරිමැදිණි දැ යි ඔබට විස්තර කළ යුතු ද? කෙතරම් පිළිකුල් දනවන, නොසැබි පවසුවෙක් ද? ඒ

'වසක දෙකක මා ඉසිලූ සෙලවුම් එරවුම් ගෙරවුම්
හද කකිය කකියා වුව

ගැහැනිය ඔසවා රුවා තම අගය
ගැහැනිය ඔය පයයට පස සිතන තරම තද නැති.'

මින් කවර අදහසෙක් නැඟේ ද? ගැහැනිය ඔසවා රුවා තම අගය මේ අන්ඩර දෙමළ නොවේ නම් වෙන කිමෙක් ද? අදහසක් නැඟෙන හැටියට වදන් කිහිපයක් ගලපා ගන්නට බැරුවයි, උසස් සරසවියෙකැ වදාරු කම් කරන්නේ.

'හිරු එළියෙන් විවර ඇය වටොර යටසින් බලා නොබලා
මින් පතයි ඇය සිසිල් සෙලුව.'

හිරු එළියෙන් විනිවිද පෙනෙනු විනා විවරව පෙනෙන්නේ කෙසේ ද? 'යටසින් බලා' මේ මහා පුදුම බැල්මකි. 'යට + අසින්' යනු 'යට පැත්තෙන්' යැ. යට පැත්තෙන් බලන බැලුම්, පිට රට ගොස් උගත් එකකුට විනා සෙස්සනට හෙළිය හැකි ද? 'යට ඇසින් බලා 'යනු ලියූ සැටියි,

'දෙ තොල දිවගා වියරුව දුවන බලු සේ'

දෙතොල දිවේ ගෑම ද කෙරෙණු, දිව ද තොලේ ගෑම ද කෙරෙණු? දෙතොල දිවේ ගා දුවන බල්ලෝ පේරාදෙණියේ විනා අන් කවර දෙසකැ සිටිති ද?" (වීරකෝන්, 1964).

දුඹුල් යනු බාල, පහත්, දුර්වල වැනි අර්ථයක් සපයන්නකි. බාල බස යන්න දුඹුල් බස යන්නෙන් කියැවෙයි. බස පමණක් නොව මෙම නිර්මාණයේ අසභ්‍ය (අසැබි) බවද හෙළ හවුල් විචාරකයාගේ ප්‍රබල කෝපයට හේතු වූ බව පෙනී යයි. සිරි ගුනසිංහගේ බසෙහි පවතින ඔහුටම අනන්‍ය වූ ව්‍යාකුල සහිත බව මේ විචාරකයාගේ ඉමහත් කෝපයට හේතුවන බව පෙනී යයි. එසේම අමරසේකරගේ කවිය පිළිබඳව කෙරුණු විවේචනයේදී මෙන්ම පද සම්බන්ධය පිළිබඳ හෙළ හවුලේ කවියා දකින අතිමහත් නොගැළපුම් මෙහිදීද මතු කරන බව නිරීක්ෂණය කළ හැකිය.

"දෙතොල දිව යා වියරුව දුවන බලු සේ" යන පදයට දෙන අර්ථයෙන් මේ බව වටහා ගත හැකිය. ඒ පදයේ ඇති නොගැළපුමක් මතුකරන මේ විචාරකයා දැඩි උපහාසයෙන් සිරි ගුනසිංහ නිරූපණය කරන එම වර්ගයේ බල්ලෝ පේරාදෙණියේ මිස වෙන කවර තැනක වාසය කරන්නේද යනුවෙන් කර්කශ උපහාසයක් එල්ල කරයි. මෙම විචාර ප්‍රවේශ විමසීමේදී පෙනී යන්නේ හෙළ හවුලේ විචාරකයාගේ දැඩි විවේචනය ව්‍යාකරණය, සභ්‍ය අසභ්‍ය භාවය ආදී කරුණු මත නිර්මාණය වී ඇති ආකාරයයි. ඔහුට අනුව පේරාදෙණි කවිය නියෝජනය කරන කවි සියල්ලම එකම ධාරාවකට එනම්, නිසඳැස් ධාරාවට අයත්වන අතර සිරි ගුනසිංහ හා ගුණදාස අමරසේකර අතර ඇති වෙනස්කම් ඔහු අදාළ කරගෙන නොමැත. එසේම නවීන භාවය ලෙස සිංහල සාහිත්‍යයේ මතු වූ නූතනවාදී ස්වරූපය පිළිබඳ ඔහු කුමනාකාර හෝ උනන්දුවක් දක්වා නොමැත. ශික්ෂණාත්මක විචාර ක්‍රමවේදයක් සඳහා උපයුක්ත කොටගත් වචන හා සංකල්ප වෙනුවට මෙහිදී හෙළ හවුලේ විචාරකයා උපයෝගී කොටගෙන ඇත්තේ රළු, පරලු, අපහාසකාමී බවත් දනවන වචන මාලාවකි. එසේම පේරාදෙණි කවිය බිහි වූ පසුබිම - විශේෂයෙන්ම බටහිර සාහිත්‍යයෙන් හා නූතනවාදී සාහිත්‍යයෙන් ලබා ඇති ආභාසය පිළිබඳ මේ විචාරකයාගේ කිසිදු අවධානයක් යොමු වී නැති බව පෙන්වා දිය හැකිය. තෙන්නකෝන්ගේ මෙන්ම වීරකෝන්ගේද විවේචන පවසන්නේ පේරාදෙණි සාහිත්‍ය ව්‍යාපාරයට නිර්මාණාත්මක හා න්‍යායාත්මක පදනම සැපසූ (Modernism: නූතනවාදය) හා Practical Criticism (ප්‍රායෝගික විචාරය) යන ව්‍යාපාර වෙත කිසිදු

අවබෝධාත්මක අවධානයක් හෙළ හවුලේ විචාරකයන් විසින් ලබා දී නැති බවයි. තෙන්නකෝන් හෙළ වහර, හෙළ නියර ආදී සංකල්ප හඳුන්වා දුන්නද ඒවා එහි ස්වභාවය කුමනාකාරද යන්න පිළිබඳ පැහැදිලි ශාස්ත්‍රීය පදනමක් පෙන්වා දී නැත. වීරකෝන්ගේ විචාරයේදී 'හඩු' යන්න විශේෂණය යොදා තිබෙන්නේ නිසි පද ගැළපුමක් නැති පිළිගත් ව්‍යාකරණ නීතිරීති උල්ලංඝනය කරන වැනි අර්ථ ජනනය කිරීම සඳහා බව පෙනේ. තෙන්නකෝන් සරච්චන්ද්‍රගේ විචාර කලාව හඳුන්වා ඇත්තේ 'රාජ පඬිතුමාගේ තුති පත් මිටිය' ලෙසය. එනම් ඒ ඒ අයට අවශ්‍ය නම් යොදා එකම කවිය සංඥානාමකරණය පමණක් වෙනස් කරමින් ප්‍රශස්ති කවි තනා දෙන සිංහල කවියකුගේ ඒකීය ආකෘතියක් ලෙස සරච්චන්ද්‍ර විචාර කලාව හඳුනා ගනිමිනි. විචාරකයකුගේ ප්‍රශස්තිමය ලක්ෂණ උපහාසයට ලක්කිරීම සඳහා (එදිරිවීර සරච්චන්ද්‍රට වුවත් එම සත්‍ය වලංගු බව කිව හැකියි) උපහාසාත්මක යෙදුම් යෙදීමේ හැකියාව ඇතත් එම විචාරකයාගේ විචාර දර්ශනය පිළිබඳ යමක් එවැනි විචාරයකින් විමර්ශනය කළ හැකිද යන්න ගැටලුවකි. විශේෂයෙන්ම විශ්ව සාහිත්‍යයේ ආභාසය විවිධාකාරයෙන් ලබා ගැනීම පිළිබඳ තෙන්නකෝන්ගේ මෙන්ම වීරකෝන්ගේද අවධානය යොමු නොවූ බව පෙනේ.

හෙළ හවුලේ සාමාජිකයකු නොවුණද පේරාදෙණි සාහිත්‍යයට හා සාහිත්‍ය දර්ශනයට ප්‍රබල විවේචනයක් එල්ල කළ වංශනාථ දේශබන්දුද මෙබඳු විවේචනාත්මක ප්‍රවේශයක් ගත් ආකාරය නිරීක්ෂණය කළ හැකිය. ඔහු තම සාහිත්‍ය කොල්ලය කෘතියේදී පේරාදෙණි සාහිත්‍ය ව්‍යාපාරයට එරෙහිව ගොඩනඟන ඇතැම් ප්‍රවාදවල සිත් ඇද ගන්නා උපහාසාත්මක ශෛලියක් ගැබ්ව ඇතත්, ඔහුද පේරාදෙණි සාහිත්‍ය ව්‍යාපාරයේ න්‍යායයික හා නිර්මාණාත්මක පදනම් වටහා ගැනීමට සමත් නොවූ බව නිරීක්ෂණය කළ හැකිය. ඔහු නිරන්තරයෙන් පේරාදෙණි නවකථාව විවේචනය කිරීමේදී සිංහල සංස්කෘතිය සාරධර්ම හැදියාව වැනි සංකල්පය උපයෝගී කොටගත් බව පෙනේ (දේශබන්දු, 1961). එසේම ගුණදාස අමරසෙක්රගේ 'ගඟ ළඟ බුදුරුව' වැනි නිර්මාණයක් විචාරය කිරීමේ නිරත වෙමින් ඔහු පවසන පහත අදහසින් පෙනී යන්නේ හුදෙක් බුදුන් කෙරෙහි තමා සතු භක්තිය හැර වෙනත් විචාරාත්මක ප්‍රවේශයක් ඔහු සතුව නොවූ බවයි.

"කවි සමයත්, වියරණයත් පද යෝජනයත් බලු බල්ලට යේවා චිතරාගී බුදුපියාණන් වහන්සේ සමාධි සුවයෙන් වැඩ විසුමත් හමාරයි නේද?" (දේශබන්දු, 1961: 76).

එසේම සාහිත්‍ය කොල්ලය කතුවරයා පේරාදෙණිය කණ්ඩායමට එරෙහිව මතවාදී මැදිහත්වීමක් කළ ඇල්. ඇම්. ඒ. සිල්වාගේ විචාර විවරණය කෘතිය ඇතැම් තැන්වලදී සාධනීය ලෙසද උපයෝගී කොටගෙන තිබෙන බව නිරීක්ෂණය කළ හැකිය. (දේශබන්දු, 1961: 30, 31, 48). විචාර විවරණය අගය කරමින් ඔහු පවසන්නේ විචාර විවරණය පළ වූ පසු සරච්චන්ද්‍ර සාහිත්‍ය විවේචනය ගොළු වූ බවත්, එම කෘතියෙන් ගොඩනැගූ තර්ක සිඳ හෙළීමට සරච්චන්ද්‍ර, මාර්ටින් වික්‍රමසිංහ යන දෙදෙනාගෙන් එක් අයෙකු හෝ සරච්චන්ද්‍රගේ ගෝලයන් සමත් නොවූ බවත්ය (දේශබන්දු, 1961: 31). සාහිත්‍ය කොල්ලය කෘතිය සාහිත්‍ය න්‍යාය වෙනුවට ජාතිය, ආගමික භක්තිය මෙන්ම සිංහල කාව්‍ය සම්ප්‍රදාය යැයි කතුවරයා සිතන යම් නිශ්චිත ඒක රේඛීය සම්ප්‍රදායක්ද සාහිත්‍ය විවේචනයෙහි ලා උපයෝගී කොට ගනියි. තවද ඔහු ගුණදාස අමරසේකරගේ අමල් බිසෝ (1966) වැනි කාව්‍ය සංග්‍රහයක් විමර්ශනය කිරීමේදී එම කාව්‍ය සංග්‍රහයට පිටු දුන් මනෝවිශ්ලේෂණය, ලෝරන්සියානු දර්ශනය (සිරිමාන්න, 1985) වැනි කාරණා වෙත අංශු මාත්‍රයකුදු අවධානය යොමු නොකරමින් 'එය මළ පිදේනි හැල්ලක් 'ලෙස හඳුන්වයි (දේශබන්දු, 1961: 65).

විචාරකයන් පෙන්වා දෙන ආකාරයට (පවිත්‍රානි, 2016: 66-89) සිරි ගුනසිංහගේ හා ගුණදාස අමරසේකරගේ කාව්‍ය නිර්මාණය වටහා ගැනීම සඳහා බටහිර නූතනවාදයත් එහි පුරෝගාමී කවියා වූ ටී.එස්. එලියට්ගේ කාව්‍ය නිර්මාණත් පරිශීලනය කිරීම අතිශයින්ම වැදගත් පුරෝගාමී ශාස්ත්‍රීය පියවරයි. එහෙත් හෙළ හවුලේ විචාරකයන් මෙන්ම වංශනාථ දේශබන්දු වැනි පේරාදෙණි විචාර කතිකාවට එරෙහිව ප්‍රති - විචාර කතිකාව නිර්මාණය කළ බොහෝ විචාරකයන් එම පුරෝගාමී ශාස්ත්‍රීය පියවර ගැනීම වෙනුවට රට, ජාතිය, ආගම, සංස්කෘතිය හා සිංහල ව්‍යාකරණය යනාදිය තම විචාරයේ පදනම් ලෙස තෝරාගත් බව පෙනී යයි. එමෙන්ම බටහිර සාහිත්‍ය කතිකාව පිළිබඳ ඔවුන් සතු දැනුම තරමක් ව්‍යාකූල මෙන්ම තම තමන්ගේ මනෝ ලෝකවල උත්පාදිත පරිකල්පිත කාව්‍ය සංකල්ප ලෙස ද හඳුනාගත හැකිය. සිසිර කුමාර මානික්කාරච්චි (වංශනාථ දේශබන්දු යන අනවර්ථ නාමයෙන් සාහිත්‍ය කොල්ලය කෘතිය රචනා කළේද මොහු විසිනි) තම වෙනත්

ලේඛනවලදී පේරාදෙණි කණ්ඩායම හා සරච්චන්ද්‍රගේ ව්‍යාපෘතිය දැඩි ලෙස අගතිගාමි ලෙසත් විවේචනයේ කරයි (මානික්කආරච්චි, 1975: 145-155). 'සාගරයක් මැද අමන රටක් ඇත.' (1975) කෘතියේ පරිච්ඡේදයක් ලෙස ඇතුළත් කොට තිබෙන සාහිත්‍ය කොල්ලයේ අතුරු කථාවෙහි ඔහු පෙන්වා දෙන්නේ සාහිත්‍ය කොල්ලය කෘතියෙන් තමා කී දේවල් බොහෝමයක් දැනටමත් තහවුරු වී අවසන් බවයි (මානික්කආරච්චි, 1975: 153).

තවදුරටත් ඔහු මෙහිදී පවසන්නේ 'ලෝරන්ස් චේවා', 'හෙන්රි මිලර් චේවා', 'මෝරාවියා චේවා', 'වෙන මොකා චේවා' ඔවුන්ගේ ජාතිවලට උහුලන්න පුළුවන් කුණු කථා ලිව්වාට අපට කමක් නැති බවත්, අපේ රටේ නම් ඒවාට ඉඩත් දිය නොහැකි බවත්ය (මානික්කආරච්චි, 1975: 155). ජාතිය ආරක්ෂා කර ගැනීමේ වගකීම තම විචාර කලාවෙන්ද ඔහු එසේ ගොඩනගයි. හෙළ හවුල් ගුරු කුලයට නැතහොත් කණ්ඩායමට කොළඹ කවි කණ්ඩායම සමග කවිය පිළිබඳ න්‍යායාත්මක අර්බුද තිබුණි. කොළඹ කවිය නියෝජනය කළ කවීන්ටද විශේෂයෙන්ම කොළඹ කවියේ දෙවන තරංගය නියෝජනය කළ කවීන්ටද හෙළ හවුලේ බස විශේෂයෙන්ම සම්භාව්‍ය ව්‍යාපාරයට දක්වන දෘඪ භක්තිය පිළිබඳ න්‍යාත්මක විවේචන තිබුණි. රැ. තෙන්නකෝන් වවුලුවෙහි දෙවැනි වර සකස් කිරීම නමැති දෙවන මුද්‍රණයේ පෙරවදනේදී පැවසුවේ "අද මේ රටේ මිනිසා කවි යන්නෙන් අදහස් කරන්නේ රසවත් වැකිය නොවන බවත්, වහර වියත් නොවූවත්, රසසුන් වුවත්, විරිතකට එකඟවන සේ යොදන පැදිය මේ රට මිනිසා කවි ලෙස පිළිගන්නා බවත්ය" (තෙන්නකෝන්, 1962: xxiv). තවද තෙන්නකෝන් මෙහිදී පෙන්වා දුන්නේ, එවැනි කවිවලින් නගින මිහිරක් ඇත්තේ නම් ගී රසක් මිස කවි රසක් නොවන බවත්, ඒ මිහිර ගයන්නන්ගේ හඬත් තාලයත් අනුව මිසක් කවියාගේ සමත්කම පිට පිහිටා නැති බවත් ය (තෙන්නකෝන්, 1962: xxiv).

මෙහි සෘජුවේ නමක් හෝ ගුරු කුලයක් සඳහන් නොකළද එයින් ඔහු කොළඹ කවියේ දෙවන තරංගය නියෝජනය කළ කවීන් හඳුනාගත් බව ඓතිහාසික සන්දර්භය විමසා බලන විට වටහාගත හැකිය. කේයස් හෙවත් සාගර පලන්සූරිය පවසන්නේ වෙනස් වන සමකාලීන ලෝකයට අනුරූපී වන ලෙස භාෂාව හැසිරවීමට ඇතැම් උගතුන් සහ ලේඛකයන් දක්වන අසමත් බවයි.

"පොත් ලියන්නේ මීට අවුරුදු දහසකට පෙර සිටිය අයට ද
වත්මනට මිස අතීතයකට වැඩ කරන්නේ මොට්ටකමට ද"

(පලන්සූරිය. 1962: පෙරවදනේ පිටු අංකය නැත) වැනි යෙදුම්වලින් නිශ්චිතවම හෙළ හවුල නියෝජනය කරන ලේඛකයන්ගේ සම්භාව්‍ය භාෂා ව්‍යවහාරය දැඩි ලෙස විවේචනය වී තිබේ. භාෂා ව්‍යවහාරය හා භාෂාව ගැන ගොඩනගා ගත් අදහස් මත පිහිටමින් යම් යම් සංවාද පැවති නමුත් කොළඹ කවි කණ්ඩායමට හා හෙළ හවුල අතර අතිශයින් බරපතළ න්‍යායාත්මක විවාදයක් නොපැවති බව නිරීක්ෂණය කළ හැකිය. හෙළ බස, හෙළ ආර වැනි සංකල්ප කොළඹ කවීන් විසින්ද අගය කර ඇති අතර පොදුවේ කොළඹ කවීහු කුමාරතුංග මුනිදාස චරිතයට ගරු කළහ. මීමන ප්‍රේමතිලක තම නවීන පද්‍ය රචනා දෙක කොටසෙහි වර්තමාන සිංහල කවිය පිළිබඳ දීර්ඝ විමර්ශනාත්මක හැඳින්වීමක් ලියමින් හෙළ හවුලේ කවිය වෙනම අනන්‍යතාවක් සහිත කාව්‍ය ව්‍යාපාරයක් ලෙස තම පාඨකයා හට හඳුන්වාදීමට මැලි නොවීය. කුමාරතුංග මුනිදාස ප්‍රධාන තවත් සම්ප්‍රදායක කවීන් කොටසක් මේ යුගයේ ඇති වූ බවත් අදහස් විසින් ඔවුන්ගේ වැඩි දෙනෙකු ඉතා උසස් තත්ත්වයක් ගත් බවත් ඔහු පවසයි (ප්‍රේමතිලක, 1961: 56). තමා නියෝජනය කළ කාව්‍ය ධාරාවට සමාන්තරව පැන නඟින කාව්‍ය ධාරාවක් වෙත මෙබඳු ගුණාත්මක ඇගැයීමක් කිරීමට ඔහුට හැකි විය. එහෙත් පේරාදෙණි සාහිත්‍ය ව්‍යාපාරය හා සෙසු සාහිත්‍ය ව්‍යාපාර දෙක අතර එබඳු සමීප බවක් දක්නට නොලැබුණු අතර, පේරාදෙණි සාහිත්‍යය වෙනම ආගන්තුක ප්‍රපංචයක් ලෙස සෙසු විවේචකයන්ගේ අවධානයට ලක් වූ බව පෙනේ.

පී. එම්. ජයතිලක රචනා කළ සාහිත්‍ය දුර්මත විචාරය (ශ්‍රී බුද්ධ වර්ෂ 2512 - ක්‍රිස්තු වර්ෂ සඳහන් නොවේ) වැනි කෘතියකද පේරාදෙණි ගුරුකුලය විවේචනය කර ඇති මුත් එය වංශනාථ දේශබන්දු හෙවත් සිසිර කුමාර මානික්කාරච්චි තරම් අගතිගාමී හා අපහාසකාමී ප්‍රවේශයකින් සිදු නොකළ බව පරීක්ෂා කළ හැකිය. 'කිවයුතු දෙයක්' යන මැයෙන් තම පොතට පෙරවදනක් සපයන කතුවරයා පවසන්නේ සිරි ගුනසිංහගේ ඇතැම් අදහස්වලට එරෙහිව තමා ලිපි කිහිපයක් ලියූ නමුත් සියලුම අදහස්වලට එරෙහි නොවන බවත්, ඇතමුන් එසේ සිතීම සාවද්‍ය බවත්ය. එසේම එම පෙරවදනේම

කතුවරයා පවසන්නේ තමා මෙම පොත පළ කිරීමට වසර (5-6) කට පෙර ලංකා විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයකු බවයි. මෙම ලිපි සංග්‍රහයේ ඇතුළත් ලිපිවල කොළඹ කවින්, හෙළ හවුල පඬිවරුන් මෙන්ම පේරාදෙණි ගුරු කුලයට අයත් සාහිත්‍යධරයන් යන කණ්ඩායම් තුන සම්බන්ධයෙන් අදහස් දක්වා තිබේ. වංශනාථ දේශබන්ධුගේ විවේචනය සමග සසඳා බලන විට ගුණදාස අමරසේකරගේ 'ගඟ ළඟ බුදුරුව 'පැදි පෙළ පිළිබඳව ජයතිලක වෙනස් ආකාරයකින් බැලූ බව පහත විචාරය තහවුරු කරයි. 'ගඟ ළඟ බුදුරුව' නමැති පද්‍යයෙන් හෙළිවන්නේ කවියෙකුගේ එක් අදහසක් පමණි. කවියා ධර්ම දේශකයකු නොවේ. ඔහුගේ චින්තන ශක්තිය සීමා කරන බැමි නැත. ඔහුට කුමක් වුවද සිතිය හැකිය. එය ඔහුගේ දැනුම දර්ශනයන් මගින් පමණක්ම නික්මවනු ලබන්නති (ජයතිලක, මුද්‍රිත වර්ෂය නැතː 30). නිසඳැස් සම්ප්‍රදාය ගැන සාකච්ඡා කරන මේ විචාරකයා මෙසේ පවසයි. 'නිසඳැස' විවේචනය කළ බොහෝ උගත්තු සාහිත්‍ය කුලවලට බෙදී පේරාදෙණියට ගැරහුහ. කොළඹ කවින් හා පේරාදෙණි කියා දෙකොටසක් බෙදිණ. මෙය උගත් සාහිත්‍යධරයන්ට පමණක් නොව මිනිසත් බවටද කරන ලද නිග්‍රහයකි" (ජයතිලක, මුද්‍රිත වර්ෂය නැතː 36). තවත් වරක් ඔහු ගුණදාස අමරසේකරගේ 'යළි උපන්නෙමි' කෘතිය ගැන මෙසේ පවසයි. 'යළි උපන්නෙමි' නවකථාවෙහි කථකයා මුඩුක්කුවක වසන ගණිකාවක සමඟ සංවාසයෙහි යෙදෙන දර්ශනය පියවරක් පියවරක් පාසා විස්තර කිරීමෙන් අභිමත වස්තු විකාශනයට ලැබෙන පිටුවහල කුමක්ද? එම ග්‍රන්ථයෙහි ඇති එවැනි දර්ශන කිහිපයක් ඉවත් කළහොත් 'යළි උපන්නෙමි' අපට ඇති උසස්ම ගද්‍ය කාව්‍යයක් ලෙස අගය කිරීමට පුළුවන් වෙතැයි සිතමි" (ජයතිලක, මුද්‍රිත වර්ෂය නැතː 49). ගුනසිංහ පළ කළ අදහසක් විවේචනය කරමින් ඔහු මෙසේ පවසයි. "පේරාදෙණි නිකායෙන් මෙතෙක් කිසිම උසස් විචාරකයෙක් බිහිවී නැතැයි සිරි ගුනසිංහ මහතා පළ කරන අදහසද සදොස් යැයි කියා සිතමි" (ජයතිලක, මුද්‍රිත වර්ෂය නැතː 79). පේරාදෙණි ගුරුකුලය සම්බන්ධයෙන් සිංහල සාහිත්‍ය කතිකාවෙහි පැන නැඟි විවිධ ප්‍රවණතාවලට අවධානය යොමු කරන මෙම විචාරකයා පවසන්නේ "පේරාදෙණියේ ඉගෙනීම තබා හන්තානේ කඳු මුදුනවත් දුටු නැති අය නිසඳස් සම්ප්‍රදාය අනුගමනය කරමින් කවි ලියන බවත්, ඔවුන් කොළඹ ගුරු කුලයට හෝ පේරාදෙණි යන ගුරුකුල දෙකටම අයත් නොවන පිරිසක් බවයි" (ජයතිලක, මුද්‍රිත

වර්ෂය නැතː 96). මෙසේ විමසා බලන විට සාහිත්‍ය දූර්මත විචාරය කෘතිය එම යුගයේ සෙසු විචාරකයන්ගේ විවේචන ප්‍රවේශය සමඟ සංසන්දනය කර බලන විට යම් ආකාරයක මධ්‍යස්ථ ප්‍රවේශයකින් යුක්තව ගොඩනඟා ඇති බව පෙන්වා දිය හැකිය.

පේරාදෙණි කවියන් ලෙස සැලකිය හැකි ගුණදාස අමරසේකර හා සිරි ගුනසිංහ යන දෙදෙනාගේ කාව්‍ය නිර්මාණ පිළිබඳ තවත් විග්‍රහයක නිරත වූ විචාරකයෙකු ලෙස ඒ. එම්. ජී. සිරිමාන්න හැඳින්විය හැකිය. සිරිමාන්න තම නූතන සිංහල කවියේ බටහිර ආභාසය නම් ලිපියේ සහ 1964 දී තම සංස්කාරකත්වයෙන් පළ කළ විචාර කවි කෘතිය සඳහා ලියූ පිටු 21කින් යුක්ත හැඳින්වීමෙහි පේරාදෙණි කවිය පිළිබඳ සාකච්ඡා කරයි (සිරිමාන්න, 1964ː iii-xxi). සිරිමාන්නගේ සමස්ත සාකච්ඡාවම විහිදෙන්නේ සිංහල කවියෙහි නූතනවාදය ආරක්ෂා කර ගැනීම දෙසටය. සිරිමාන්න සිරි ගුනසිංහගේ කාව්‍ය නිර්මාණවල පවතින විශේෂ ලක්ෂණ ලෙස තමා සලකන දේවල් වෙනුවෙන් පෙනී සිටින අතර මීමන ප්‍රේමතිලක වැනි කොළඹ කවීන්ගේ කාව්‍ය නිර්මාණ මෙන්ම ඔවුන්ගේ කාව්‍ය දර්ශනයද බරපතළ ලෙස විවේචනයට ලක් කරයි. මෙසේ විමසා බලන විට 1950-1970 දශක ද්වයයෙහි සිංහල සාහිත්‍ය කතිකාව එක්තරා අන්දමකින් පේරාදෙණි නූතනවාදය හා නූතනවාදයට එරෙහි කණ්ඩායම් අතර පැවැති තියුණු සංවාදයක් ලෙස වටහාගත හැකිය.

## නිගමනය හා සමාලෝචන

විසිවන සියවසෙහි සිංහල සාහිත්‍ය කතිකාව- විශේෂයෙන්ම 1930-1980 දක්වා කාල පරාසයෙහි විහිදී ගිය සිංහල සාහිත්‍ය කතිකාව විමර්ශනය කිරීමේ දී පෙනීයන්නේ 1950-70 යන දශක ද්වයයෙහි එයට පෙර එම කතිකාව නියෝජනය නොකළ ප්‍රවණතා කිහිපයක් නිර්මාණය වූ ආකාරයයි. එම ප්‍රවණතාවෙහි වඩාත් කේන්ද්‍රීය හා බලවත් මෙන්ම සමස්ත ලාංකේය සමාජය වෙතට බලපෑම් ඇති කරන ලද කාරණය වන්නේ නූතනවාදී සාහිත්‍යය හා එම සාහිත්‍යය උදෙසා මතවාදී වශයෙන් පෙනී සිටින ලේඛකයන් හා විචාරකයන් බිහිවීමයි. මෙම පිරිස පේරාදෙණි සරසවිය කේන්ද්‍ර කොට ගෙන බිහිවිය. මෙම දශක ද්වයයෙහි උද්ගත වූ තවත් වැදගත් සාහිත්‍ය ප්‍රවණතා ලෙස සැලකිය

හැක්කේ හෙළ හවුල, කොළඹ යුගයේ දෙවන තරංගය නියෝජනය කරන කවීන් හා ඔවුන් සමඟ එක්ව කටයුතු කළ සිංහල පුවත්පත් සඟරා කතුවරුන් වැනි අවශේෂ මතවාදී කණ්ඩායම් ගොඩනැඟීමත් ඒ පිරිස (ඔවුනොවුන් අතර විවිධ මතවාදී හා වෙනත් විවිධාකාර බෙදීම් පැවැතියත්) පේරාදෙණි ගුරුකුලයෙන් මතු වූ නූතනවාදී ප්‍රවණතාවට එරෙහි වීමත්ය. මේ යුගයේ බොහෝ සිංහල පුවත්පත් හා සඟරා කතුවරුන්ම කොළඹ කවියන් වශයෙන් සාහිත්‍ය භූමිකාවට පණ දුන් නිසා පේරාදෙණි විරෝධී කඳවුරු නිශ්චිත වශයෙන්ම නිර්මාණය වීම එතරම් අපහසු කාර්යයක් බවට පත් වී නොමැත. පේරාදෙණි විරෝධී කණ්ඩායම බොහෝ විට තම කඳවුරෙහි නවකථාකරු වශයෙන් ඩබ්. ඒ. සිල්වා අගය කළ බව නිරීක්ෂණය කළ හැකිය. කවිය සම්බන්ධයෙන් ගොඩනැගුණු සාකච්ඡාවලදී පේරාදෙණි කවියන් ජාතිය, ආගම, භාෂාව මෙන්ම සංස්කෘතියද පසෙක ලා යුරෝපයේ නූතනවාදය කෙරෙහි ආසක්ත වෙමින් කටයුතු කිරීමෙහි නිරත වූ අතර අනිකුත් කණ්ඩායම එයට ප්‍රතිපක්ෂව ජාතිය, ආගම, භාෂාව හා සංස්කෘතිය සම්බන්ධ සාධක සාහිත්‍ය කලා කතිකාවෙහි වැදගත් ස්ථානයක් අත්පත් කර ගත යුතුය යන ආස්ථානයෙහි පිහිටා කටයුතු කළ ආකාරය නිරීක්ෂණය කළ හැකිය. මෙම සංවාදය නියෝජනය කළ ප්‍රධාන කණ්ඩායම් තුනක් හඳුනාගත හැකිය.

ඒවා නම්, පේරාදෙණි සරසවිය කේන්ද්‍ර කොටගත් නූතනවාදී සාහිත්‍යධාරාව පිළිගත් කණ්ඩායම, හෙළ වහර, හෙළ බස යන ව්‍යවහාරයන්ට ප්‍රමුඛ ස්ථානය ලබාදුන් එනම්, රට දැය හා සමය යනුවෙන් එම යුගයේ ප්‍රචලිතව පැවැති අධිපතිධාරී කතිකාවට එරෙහිව දෙස, බස හා රැස යන විකල්ප කතිකාව රැගෙන ආ කුමාරතුංග මුනිදාසගේ නායකත්වයෙන් යුක්තව නිර්මාණය වූ හෙළ හවුල කණ්ඩායම සහ බටහිර රෝමැන්ටිකවාදී කාව්‍ය ප්‍රවණතාවෙන් මෙන්ම, දේශීය කාව්‍ය ප්‍රවණතාවෙන්ද යම් ආකාරයකින් පෝෂණය ලැබූ කොළඹ කවියේ දෙවන තරංගය නියෝජනය කළ කවීන් හා (මේ පිරිසෙන් ඇතමෙක් නිදසුනක් ලෙස මීමන ප්‍රේමතිලක, බොරලැස්ගමුවේ විමලසිරි පෙරේරා, එච්. එම්. කුඩලිගම යන ආදීන් පූර්ණ කාලීනව හෝ අර්ධ කාලීනව සිංහල පුවත්පත් හා සඟරාවල සේවයෙහි නිරත වූ ආකාරය ඔවුන්ගේ චරිත කථා අධ්‍යයනයේදී හෙළි වේ). සිංහල පුවත්පත්, සඟරා සංස්කරණය හා ඒවායේ ප්‍රමුඛ ලේඛකයන් වශයෙනි.

මෙම ප්‍රධාන කණ්ඩායම් තුනෙහි යම්, යම් මතවාදී ගැටුම සහිතව උපකණ්ඩායම් හෝ පුද්ගලයන්ද සිටි බව නිරීක්‍ෂණය කළ හැකිය. නිදසුනක් ලෙස පේරාදෙණි කණ්ඩායම තුළ ගුණදාස අමරසේකරට හා සිරි ගුනසිංහ සිංහල කවිය හා නවකථාව සම්බන්ධයෙන් විවිධ අදහස් පැවැති බවත්, ඔවුන් එකිනෙකට වෙනස් කාව්‍ය සම්ප්‍රදායන් අනුගමනය කළ බවත්, ඔවුන්ගේ ප්‍රථම කාව්‍ය සංග්‍රහ දෙක වන භාව ගීත (1955) හා මස් ලේ නැති ඇට (1956) යන කාව්‍ය සංග්‍රහ දෙකම සිංහල කවියෙහි වෙනස් වෙනස් ආර නියෝජනය කරන බවත් නිරීක්ෂණය කළ හැකිය. එහෙත් ඒ දෙකටම පොදුවේ ටී. එස්. එලියට් කේන්ද්‍ර කොට ගත් බටහිර නූතනවාදය වෙත තම මතවාදී ළැදියාව පළ කළ අතර පොදුවේ නූතනවාදී මතවාදය පිළිගත් බව කිව හැකිය.

පේරාදෙණි කණ්ඩායමේ නූතනවාදී බව තරයේම ප්‍රතික්ෂේප කිරීමෙන් නූතනවාදයේ පවතින සාහිත්‍ය හර පද්ධතිය අවබෝධ කරගැනීම සඳහා ඇති මතවාදීමය අසමත්කමත් වංශනාථ දේශබන්දුගේ විචාර කලාවෙහි කැපී පෙනෙයි. අමල් බිසෝ කාව්‍ය සංග්‍රහය 'මළ පෙරේතයාදින්නක්' ලෙස දකිමින් (දේශබන්දු, 1961: 61) එහි නිරූපිත ලිංගික ජීවිතය හා බැඳි කථා පුවත නිසා එයට 'මදන කුලප්පුව' යන නම් ලබාදිය යුතු යනුවෙන් යෝජනා කරන විට, (දේශබන්දු, 1961: 61) කථා පුවතේ ගැබ් වෙන ලිංගික ආවේශයෙන් බැට කන සදාතනික මිනිසත් බවට උරුම වූ යථා ස්වභාවය පිළිබඳ නූතනවාදී ප්‍රවේශය මුළුමනින්ම ප්‍රතික්ෂේප වන බව පෙනේ. ඇල්. එම්. ද සිල්වා වැනි විචාරකයන් වංශනාථ දේශබන්ධු ගණයෙහිලා සැලකිය නොහැකි මුත් ඔහු ද නූතනවාදී හා යථාර්ථවාදී සාහිත්‍ය ධාරාවෙහි පවතින සාරාර්ථ මුළුමනින්ම අවබෝධ කරගැනීමට අපොහොසත් වූ විචාරකයකු ලෙස හඳුනාගැනීමට සිදුවේ. මේ යුගයේ විචාර කතිකාව විමසූ ඇතැම් පසුකාලීන විචාරකයන් පෙන්වා දෙන ආකාරයට සිල්වාගේ විචාර කලාව තරමක් තාර්කික හා ශාස්ත්‍රීය ස්වරූපයක් අත්පත්කර ගත් අතර එම විචාර කලාවේ කේන්ද්‍රීය අර්බුදය වූයේ ඩබ්. ඒ. සිල්වාගේ කථා කලාව අතිශෝක්ති සහගතව අගය කිරීමත් යථාර්ථවාදය හා ප්‍රබන්ධ කලාවේ සමාජ, දේශපාලන හා සංස්කෘතික මෙහෙවර අතර පරතරය වටහා නොගැනීමත් යනුවෙන් පළ වී ඇති අදහස්වලට (රණසිංහ, 2024: 50-51) එකඟ විය හැකිය. එබඳු වෙනස්කම් පැවතිය මුත් වංශනාථ දේශබන්දු හෙවත් සිසිර කුමාර මානික්කාරච්චි සහ ඇල් ඇම්. ඒ. සිල්වා යන දෙදෙනාට කොළඹ කවියන් හා සිංහල පුවත්පත් කලාවේදීන්ගේ

කණ්ඩායම වෙත මතවාදී සහයෝගයක් දැක්වූ විචාරකයන් ලෙස හැඳින්විය හැකිය. පේරාදෙණි ගුරුකුලයේ මතවාදය නියෝජනය කළ එහෙත් ආයතනික වශයෙන් පේරාදෙණි සරසවියට සම්බන්ධ නොවූ විචාරක භූමිකාවක් ලෙස ඒ. එම්. ජී. සිරිමාන්න හඳුනාගත හැකිය. විමංසා නවකථා අංකය සඳහා ඔහු ලියූ ඩී.එච්. ලෝරන්ස් සහ ගුණදාස අමරසේකරගේ නවකථා (1964) ලිපිය ඉතා ප්‍රබල ලෙස අමරසේකරගේ නූතනවාදී සාහිත්‍ය භාවිතය සාධාරණීකරණය කළ විචාර ලේඛනයක් බව නිගමනය කළ හැකිය (සිරිමාන්න, 2002: 101-123). ගුණදාස අමරසේකර නූතනවාදය සමඟ මැනවින් අනන්‍ය වන ආකාරය මෙහිදී ඔහු අවබෝධ කරගන්නා අතර සාහිත්‍යමය නොවන නිර්ණායක සියල්ල අතික්‍රමණය කරමින් පේරාදෙණි නූතනවාදය ගැඹුරින් පිළිගැනීමට ඔහු සමත් වෙයි. එහෙත් සාහිත්‍ය දූර්මත විචාරය ලියූ පී. එම්. ජයතිලක වැනි රචකයෙකු හුදෙක් එක් පක්ෂයකට ඇද නොවැටී යම් ආකාරයකින් මධ්‍යස්ථ ප්‍රවේශයකින් කටයුතු කිරීමට උත්සාහ කොට ඇති බව නිරීක්ෂණය කළ හැකිය. එනමුත් ඔහුගේ න්‍යායාත්මක ප්‍රවේශය සිරිමාන්නගේ වැනි ගැඹුරු අවබෝධාත්මක බවක් පෙන්වන්නේ නැත. පේරාදෙණිය විවේචනය කළ හෙළ හවුල් නියෝජිතයන්ට විශ්ව සාහිත්‍යය සම්බන්ධයෙන් යම් අවබෝධයක් හා අදහසක් ඇති බව රවීන්ද්‍රනාත් තාගෝර් වැනි රචකයකුගේ කෙටිකථා සිංහලයට පරිවර්තනය කිරීමට නැඹුරුවීම මඟින් නිරීක්ෂණය කළ හැකිය. එබඳු අවබෝධයක් පැවතියද බටහිර නූතනවාදය පිළිබඳ පැහැදිලි අවබෝධයක් දා. දු. න. වීරකෝන් වැන්නෙකු තුළ නොතිබූ බව ඔහු තම පොතට ලියූ හැඳින්වීම පවසයි. නූතනවාදය තුළ තිබූ මනෝ විශ්ලේෂණාත්මක හා භාෂාත්මක නවීකරණය ඔහුට අභිමත නොවූ බව ගුණදාස අමරසේකර හා නන්දසේන රත්නපාලගේ නිර්මාණ අරබයා වීරකෝන් පවසන අදහස්වලින් පෙනෙයි. ඊ. තෙන්නකෝන් පේරාදෙණියට විශේෂයෙන්ම එදිරිවීර සරච්චන්ද්‍රට එරෙහිව ඉදිරිපත් කළ විවේචනයද පවසන්නේ සරච්චන්ද්‍රගේ මෙහෙවර පිළිබඳව ඔහු තුළ තිබූ අනවබෝධයයි. එම අනවබෝධයද නිශ්චිතවම බටහිර නූතන සාහිත්‍ය හා විචාර කතිකාව කෙරෙහි ඇති අනවබෝධයක් ලෙස නිගමනය කළ හැකිය. නිශ්චිත වශයෙන්ම කතුවරුන් හා සාහිත්‍යකරුවන් හෝ අදාළ කෘති පිළිබඳව සඳහන් නොකරන තෙන්නකෝන් පවසන්නේ 'හෙළ කවියෙකුගේ පබඳ විනිසීමට පිළිනි වූ ඉංගිරිසි විමිසුම් නියැ ය ගැනීම' (තෙන්නකෝන්, 1957: xvi) වැනි අදහස්ය බටහිර සාහිත්‍ය කතිකාව පිළිබඳ ඔහු තුළ

පැවති නිරවුල් නොවන දැනුම පිළිබඳව කදිම උදාහරණයක් ලෙස මෙම ප්‍රකාශ සැලකිය යුතුය යනුවෙන් නිගමනය කළ හැකිය.

පොදුවේ ගත් විට පේරාදෙණියට එරෙහි කණ්ඩායම් ද්වයයෙහිම පැවැති කේන්ද්‍රීය අදහස බටහිර නූතනවාදයට එරෙහි වීමත්, නූතන සාහිත්‍යය සිංහල සාහිත්‍යයක් ලෙස අඛණ්ඩ හා ආරක්ෂා කළ යුතු ජාතික උරුමයක කොටසක් ලෙසත් දැකීමය. පේරාදෙණිය එයට ප්‍රතිපක්ෂව වර්තමාන සිංහල සාහිත්‍යයේ කොටසක් බවට තම සාහිත්‍ය කතිකාව පත් කොට තිබේ. සරත් අමුණුගම ප්‍රකාශ කළ ආකාරයට නූතන ලේඛකයා රචනයක් කරන්නේ සිංහලයෙකු වශයෙන් නොව එක්තරා මිනිස් ශිෂ්ටාචාරයක සාමාජිකයකු වශයෙන්ද වන අතර සිරි ගුනසිංහ වැනි කවීන්ගේ කවි විමර්ශනය කිරීමේදී ලෝක සංග්‍රාම, විප්ලව ආදියද සැලකිල්ලට ගත යුතුව පවතී (අමුණුගම, 2007: 155).

මේ අනුව 1950-70 දශක ද්වයයෙහි සිංහල සාහිත්‍ය කතිකාව විමසා බැලීමේදී ඒ තුළ ප්‍රධාන මතවාදී කණ්ඩායම් තුනක ගොඩනැගී තිබුණු ආකාරයත් එහි කේන්ද්‍රීය දෘෂ්ටිවාදී කාරණය වූයේ බටහිර නූතනවාදයට පක්ෂවීම හා විපක්ෂවීම බවත් නිගමනය කළ හැකිය. පේරාදෙණියට ප්‍රතිපක්ෂව ගොඩනැගුණු කණ්ඩායම් අතර නොයෙක් ආකාරයේ දෘෂ්ටිමය ගැටුම් පැවතුණත් පොදුවේ ඔවුන් නූතවාදයට එරෙහි මතවාදයක සිටි බව නිගමනය කළ හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අමරදාස, වීරසිංහ. *මහාචාර්ය ධර්මසිරි රත්නසූරියගේ සංස්කෘතික හා අධ්‍යාපනික සංකල්ප.* සංස්කෘති 2011 අප්‍රේල් 21 කලාපය අංක 03, 04. බොරලැස්ගමුව: සංස්කෘති ප්‍රකාශකයෝ, 2010.

අමුණුගම, සරත්. *සංස්කෘතිය සමාජය හා පරිසරය.* කොළඹ: නුවණ මාධ්‍ය සේවා, 2007.

කේයස්. *කාලකන්නියා.* කොළඹ: ඇම්. ඩී. ගුණසේන සමාගම, 1962.

ජයතිලක, කේ. *මා දන්නා වෙ. වි. කේ. බී. ඒ. එඩ්මන්ඩ් (සංස්). වෙ. වි. හරසර ලිපි සරණිය.* කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම, 1998.

තෙන්නකෝන්, රැ. *අපේ කවි.* කොළඹ: ඇම්. ඩී. ගුණසේන සමාගම, 1957.

තෝරදෙණිය, සේන. *පේරාදෙණිය ගුරුකුලයේ උපත නැගීම හා බිඳ වැටීම.* කොළඹ: සුරස ප්‍රකාශකයෝ, 2018.

දිසානායක, හියුබත්. *පද්‍ය විනෝදය.* කොළඹ: ඇම්. ඩී. ගුණසේන සමාගම, 1957.

දේශබන්දු, වංශනාථ. *සාහිත්‍ය කොල්ලය.* ප්‍රකාශක: ඇච්වින් රණවක, 1961.

ධර්මසේකර, කේ. එච්. ඒ. *කථා රජ කතාව* (ඩබ්ලිව් ඒ සිල්වා චරිතය). කොළඹ: වෙනුර ප්‍රින්ටර්ස්, 1963.

ධර්මදාස, කේ. එන්. ඕ. (සංස්). *ලංකා විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශයේ ආරම්භය හා විකාශනය 1943 සිට 1967.* කෝපරහේවා, සඳගෝමි. සිංහල අධ්‍යයනාංශයේ වෘත්තාන්තය: ලංකා විශ්වවිද්‍යාලය හා කොළඹ විශ්වවිද්‍යාලය. කොළඹ විශ්වවිද්‍යාලය. සිංහල අධ්‍යයනාංශය, 2019.

ධර්මදාස, කේ. එන්. ඕ. *ලේඛනය භාෂණය හෙවත් භාෂා ද්වීරූපතාව.* කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 2021.

ප්‍රඥාරාම, යක්කඩුවේ. *වනකතා මිතුරන්ගේ අගේ.* පැලියගොඩ: විද්‍යාලංකාර ප්‍රකාශන, 2019.

මානික්කාරච්චි, සිසිර කුමාර. *සාගරයක් මැද අමන රටක් ඇත.* කර්තෘ ප්‍රකාශනය, 1975.

විජේගුනසිංහ, පියසීලි. *නූතන සිංහල පද්‍ය කාව්‍යය පිළිබඳ විමර්ශනයක්-ජාතික ව්‍යාපාරය හා සම්බන්ධ කවීන්ගේ පටන් අද්‍යතන කවීන් දක්වා.* කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම, 2017.

වික්‍රමසිංහ, කේ. ඩී. පී. *නූතන සිංහල සාහිත්‍යය.* කොළඹ: ඇම්. ඩී. ගුණසේන සමාගම, 1965.

වික්‍රමසිංහ, පී. ආර්. *බණ්ඩාරනායක.* වැල්ලම්පිටිය: සුභද්‍රා යන්ත්‍රාලය, 1960.

වීරකෝන්, දා. දූ. න. *රිවිඳුරු නා ටකුර කිවිඳුන්ගේ සුදාව.* කොළඹ: ඇම්. ඩී. ගුණසේන සමාගම, 1962.

රණසිංහ, චින්තක. *අපරිපූර්ණ විචාර සටහන් සිංහල සාහිත්‍ය විචාරය පිළිබඳ කෙටි සටහන් කිහිපයක්.* රාජගිරිය: අගහස් ප්‍රකාශකයො, 2024.

රණසිංහ, චින්තක. *ඊ. තෙන්නකෝන්ගේ භාෂා දෘෂ්ටිවාදය හා 1940-60 කාලච්ඡේදයේ සිංහල සාහිත්‍ය කතිකාව.* කොළඹ සරසවියේ සිංහල දර්ශනපති (Mphil) උපාධිය සඳහා ඉදිරිපත් කළ නිබන්ධයේ අමුද්‍රිත පිටපත 2011/mphill/190), 2011.

සරච්චන්ද්‍ර, එදිරිවීර. (සංස්). *දහනම වැනි සහ විසිවැනි ශතවර්ශවල සිංහල භාෂාව හා සාහිත්‍යය.* අමරසිංහ, ජයන්ත. නූතන සිංහල සාහිත්‍ය ප්‍රවේශිකා. බොරලැස්ග මුව: විසිදුනු ප්‍රකාශකයෝ. 2016.

සරච්චන්ද්‍ර, එදිරිවීර. *සිංහල නවකථා ඉතිහාසය හා විචාරය.* මහරගම: සමන් මුද්‍රණාලය, 2015.

සිරිමාන්න, ඒ. එම්. *ජී. ඩී. එච්. ලෝරන්ස් සහ ගුණදාස අමරසේකරගේ නවකථා.*

*වීමංසා නවකතා අංකය.* කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම, 2002.

සිරිවර්ධන, සුසිල්, විජේසූරිය, එස්. විමලරත්න කුමාරගම සංස්කාරක සටහන්. *විමලරත්න කුමාරගමගේ එකතු කළ කවි.* ප්‍රකාශක: සුසිල් සිරිවර්ධන. 1987.

සිල්වා, ඇල්. ඇම්. ඒ. *විචාර විවරණය.* කොළඹ: ඇම්. ඩී. ගුණසේන සමාගම, 1959.

සිල්වා, නලින් ද. *මාර්ටින් වික්‍රමසිංහ සහ ජාතික චින්තනය.* මොරටුව සරසවිය: සිංහල සාහිත්‍ය සංගමය, 1992.

සුමනසේකර, ගාමිණී. *පේරාදෙණිවාද මුසාවාද හා අවලාද.* කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම, 2021.

Alwis, James De. *Sidath Sanagarawa, A Grammar of the Sinhalese Language.* Colombo: Government Press, 1852.

Dharamadasa, K. N. O. *The Peradeniya Contribution to Literature, Theater and the Arts.* K. M. De silva and G. H. peiris (ed.). The University System of Sri Lanka-Vision and Reality. Kandy: ICES, 1995.

Dissanayake, Wimal. *Sinhala Novel and the public sphere-Three-Illustrative Moments***.** Boralesgamuwa: Visidunu Prakashakayo, 2020.

Dissanayake, Wimal. *Purism, Language, and Creativity: The Sri Lanka Experience.* Jermudd Bjorn. H, Shapiro. Michae (ed). The Politics of Language, 2011.

Gunasinha, Siri. *The New Note in Contemporary Sinhalese Poetry.* The Observer Annual magazine, 1950.

Jayatilake, Tissa. *E. F. C. Ludowyk Memorial Lecture.The Legacy of Professor E. F. C. Ludowyk an overview of the promise and Performance of the University of Ceylon,* Senate Room, University of Peradeniya, 2018.

Lynn, Steven. *Texts and Contexts – Writing about Literature with Critical Theory.* Harper Collins College Publishers, 1998.

Obeyesekere, Ranjini. *Sinhala Writing and the New Critics.* Colombo: M.D. Gunasena, 1973.

Perera, Sasanka. (ed.). Newton Gunasinghe: *Selected Essays.* Colombo: Social Scientists Association, 1996.

Ranasighe, Chinthaka. *Scholars in the Frist Half of the 20th Century in Sri Lanka and Their Contributions Towards the Development of the Sinhala Language.* Samprasadana Essays in Honor of K. M. P. Kulasekera. Department of History, University of Kelaniya, 2016.

Samaranayake, Ajith. *A first and last Intelligentisia.* Sanday Observer, 2023.

Schubert, Andi, *A Manifesto for the Post: The Past Conditional Temporalities of*